**පුවත්පත**
**නිවසටම ගෙන්වා ගැනීමට**
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න

අරුණ
2023 ජුලි 31 සඳුදා | හතර වැනි කාණ්ඩය | 255 කලාපය | මිල රු 60.00 | www.aruna.lk

5-12 පිටුවල ඇති QR කේත ස්කෑන් කර පුවතේ වීඩියෝව නරඹන්න

# ඇඟිලි සලකුණු මැෂිමෙන් දොස්තරලා නිදහස්



## GMOA ඉල්ලීමට ජනපතිගෙන් තීන්දුවක්

■ උදයජීව ඒකනායක/ වරුණි පෙරමුණ

සෞඛ්‍ය අමාත්‍යංශයේ වෛද්‍ය පරිපාලන සේවයේ සහ විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට සිය දෛනික පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු භාවිතය අනිවාර්ය කිරීමේ තීරණය රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ඉල්ලීම මත නතර කිරීමට ජනාධිපති රනිල් වික්‍රමසිංහ තීරණය කර ඇත. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය හා ජනාධිපතිවරයා අතර පසුගිය සිකුරාදා (28වැනිදා) පැවැති සාකච්ඡාවේදී මෙම තීරණය ගෙන ඇත.

02 පිටුවට

## පැවිල්ලෙ සැරට රට හාල් ගේන්න වෙයි

-කෘෂිකර්ම ඇමැති

■ සාලිය කුමාර ගුණසේකර

දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් වී, කෙසෙල් ඇතුළු අනෙකුත් භෝගවලට සිදුවිය හැකි

02 පිටුවට

## අධි ආරක්ෂිත කලාපයේ යකඩ වැටකටත් කුඩ්ඩෝ වැඩේ දීලා

**මාසයක් තිස්සේ බට ගලවන් පටවගෙනත් ගිහින්**

තිස්ස රවීන්ද්‍ර පෙරේරා

අරගල සමයේ පාර්ලිමේන්තු අධි ආරක්ෂිත කලාපයේ ආරක්ෂාවට කථා නායක නිල නිවස ඉදිරිපිට සවිකර තිබූ යකඩ වැටේ තිබූ යකඩ බට තුන්සිය ගණනක් හා යකඩ ක්ලිප් මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් ගලවාගෙන ගොස් ඇතැයි වැලිකඩ පොලිසියට යුද හමුදාවෙන් පැමිණිලි කර ඇත.

02 පිටුවට

## රට යන තරුණයන් බියවද්දා ගුවන්තොටේ කප්පම් ගන්න කල්ලියක්

**නායකයා ආගමන විගමන නිලධාරියෙක්**

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

සංචාරක වීසා මගින් රැකියා සඳහා කොරියාව ඇතුළු රටවලට විදේශගතවීමට ගුවන් තොටුපොළට එන තරුණයන් බියවද්ද ඇමරිකන් ඩොලර් දෙසීය බැගින් ගන්නා බව කියන ආගමන විගමන නිලධාරියකුගෙන් සමන්විත සංවිධානාත්මක කල්ලියක් ගැන විමර්ශනය කිරීමට මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත වාර්තාවක් ලැබී ඇත.

02 පිටුවට

## දේවාශිර්වාද....



පිටකොටුව ශ්‍රී කදිර්වේලායුදසාමි දේවාලයේ ඊයේ (30වැනිදා) පැවැති වාර්ෂික වේල් පෙරහරේදී දේව ආශිර්වාදය ලබා ගැනීම සඳහා අගමැති දිනේෂ් ගුණවර්ධන, කතානායක මහින්ද යාපා අබේවර්ධන ඇතුළු පිරිස එක්ව සිටි අයුරු.

ඡායාරූපය - සමන් අබේසිරිවර්ධන

## වතුර ගැහුවා කියලා මානසික රෝගියාට ගහලා මරලා

**අංගොඩ සේවකයෝ 4ක් රිමාන්ඩ්**

■ එෆ්.අස්ලම්

අංගොඩ මානසික රෝහලට ඇතුළත් කළ මානසික රෝගියෙකු පහරදී ඝාතනය කර ඇත්තේ නාන කාමරය අසලදී රෝහල් සේවකයන්ට වතුර ගැසීමෙන් වූ සිද්ධියකින් පසුව බව අනාවරණය වෙයි. නුගේගොඩ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජේ.ඒ.ජේ. ජයමහගේ මෙහෙයවීම මත විශේෂ පොලිස් කණ්ඩායමක් විසින් කරන ලද විමර්ශනයේදී මේ බව අනාවරණය වී ඇති අතර වැදගත් සී.සී.ටී.වී. දර්ශන ද පොලිසිය භාරයට ගෙන ඇත.

02 පිටුවට



## නටන්න නැතිව මෛත්‍රී දුකෙන්

■ ආර්.එස්. ධර්මදාස - බලපිටිය

"මටත් නටන්න පුදුම ආශාවක් තිබුණා. නමුත් මම ගියේ නෑ. ගියා නම් මාධ්‍ය හා සමාජ මාධ්‍ය මා පතුරු ගහලා අවසන් කරයි" යැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ඉකුත් 29 වැනිද අම්බලන්ගොඩ පැවති එම පක්ෂයේ ආසන බලමණ්ඩල රැස්වීමේදී පැවසීය.

02 පිටුවට

## ජාතික පාපන්දු කණ්ඩායමට යළි පණ දීම 15 දා?

12 පිටුවට

## උපාසිකාවන් වගේ ඇවිත් මාල කඩන කල්ලියක් අනුරාධපුර

■ දීපා වසන්ති එදිරිසිංහ

සුදුවතින් සැරසී වන්දනාමාන කරන මුවාවෙන් පැමිණ අනුරාධපුර පූජා භූමියේ රන්මාල සොරකමේ යෙදුණු කාන්තාවන් නවදෙනෙකු සැකපිට අත්අඩංගුවට ගත් බව අනුරාධපුර පොලිසිය පවසයි.

02 පිටුවට




## වකුගඩු අහිමි වූ දරුවාගේ මරණය ගැන විමර්ශනයක්

■ දීපා වසන්ති එදිරිසිංහ

නරක් වූ වකුගඩුව ඉවත් කිරීමේ සැත්කම අතරතුර නිරෝගී වකුගඩුවක් ඉවත් කිරීම නිසා රෝගාතුරව මියගිය දරුවා සම්බන්ධයෙන් රෝහල් මට්ටමින් මූලික විමර්ශනයක් ආරම්භ කළ බව රිජ්වේ ආර්යා ළමා රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ජී. විජේසූරියය 'අරුණ' ට ඊයේ (30) පැවැසීය. එම වාර්තාව හැකි ඉක්මණින් සෞඛ්‍ය අමාත්‍යංශය වෙත යොමු කිරීමට පියවර ගන්නා බවද ඔහු සඳහන් කළේය.

02 පිටුවට

## සනෝජා බිබිලේගේ නිවැරැදි කිරීමයි

05 පිටුවට



## හොරෙක් ඇල්ලුවහම මාධ්‍ය ගහන්නේ මට

-රාජ්‍ය ඇමැති චාමර සම්පත්

■ චාමර පල්ලේගෙදර

"එද මම එප්පාවල ලංකා රාජ්‍ය පෝස්පේට් සමාගමට ගිහින් එහි විධායක නිලධාරියාට කියන්න ඕන භාෂාවෙන් කියපු නිසා තමයි එය මාධ්‍ය හරහා ගිහින් මාත් බැණුම් අහලා රටත් දැනගත්තේ" යැයි ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය ඇමැති චාමර සම්පත් දසනායක පැවැසීය.

02 පිටුවට

## හොරු අල්ලන්න සවිකරපු CCTVත් හොරු ගලවලා

■ ලක්බිත විද්‍යාසේකර - කළුතර

යට්ටපාත සිංහරාජ උද්‍යානය ප්‍රදේශයේ වගා බිමක සිදුවූ සොරකම් වැළැක්වීම සඳහා සවිකර තිබූ ආරක්ෂිත කැමරා පද්ධතියද සොරුන් විසින් ගලවාගෙන යාමේ සිද්ධියක් පිළිබඳව තිනියාවල පොලිසිය පරීක්ෂණ පවත්වයි. මෙම වගා බිමේ හිමිකරුවූ කළුතර දෙදියවල පදිංචි උපාලි ප්‍රියනාත් යන අය විසින් පොලිසියට කරන ලද පැමිණිල්ල අනුව මෙම පරීක්ෂණ ආරම්භ කොට තිබේ.

02 පිටුවට

# ගන්නෝරුව රණබිම රාජකීය විද්‍යාලය


පාසලේ නිර්මාතෘ පාලිත ඇල්කඩුව


නත්තල් කැරොල් තරගාවලිය දෙමළ මාධ්‍යය


ගුරු මණ්ඩලය


රයිෆල් බලකාය
ශිෂ්‍ය නායක මණ්ඩලය


27 සංවත්සරය



රයිෆල් බලකාය

1938 වෛතිහාසික ගන්නෝරු සටනේදී පෘතුගීසින් හා සටන් වැද ජය ගත් ජයභූමියේ ස්ථාපනය කළ ගන්නෝරුව රණබිම රාජකීය විද්‍යාලය, අතීත රණවිරුවන්ට උපහාරයක් ලෙස නම් කර ඇත. වීරෝධාර රණවිරුවන් සිහිකිරීම සඳහා විදුහල අබියස රණවිරුවකුගේ ස්මාරකයක් ද ඉදිකර ඇත. එවකට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ව සිටි පාලිත ඇල්කඩුව මහතාගේ සංකල්පයක් වූ ස්වදේශිකයන්ට රාජකීය පාසලක් ස්ථාපිත කිරීමේ සිහිනය යථාර්ථයක් කරගැනීම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍ය ඩබ්. පී.බී. දිසානායක දේශපාලන නායකත්වය ලබා දුන් අතර කන්ද උඩරටින් බිහි වූ ප්‍රථම ජනාධිපති වූ දිවංගත ඩී. බී. විජේතුංග මහතා ඒ සඳහා අවශ්‍ය භූමිය ලබා දෙමින් මුදලින් ආධාර කළේය. සෞම්‍යමූර්ති තොන්ඩමන් මහතා නේවාසිකාගාර ඉදිකිරීම සඳහා ඉඩකඩ හා මූල්‍යමය දායකත්වය ලබා දෙන ලදී. මේ අනුව 1994 වසරේ මුල්ගල තබා වැඩ ආරම්භ කර 1996 මාර්තු 02 ද 6 හා 7 ශ්‍රේණිවලට සිසුන් තුන්සිය විසිදෙනෙක් හා ගුරු භවතුන් දසදෙනකුගෙන් රණබිම රාජකීය විද්‍යාලය ආරම්භය වීය. මධ්‍යම පළාත් සභාවට අයත් පාසලක් වන මෙම පාසලටම අනන්‍ය වූ ප්‍රඥප්තියක් ඇති අතර සියලු සිසුන් 6 වසරට බඳවා ගන්නේ මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්වලට සීමා වූ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් පවත්වන තරග විභාගයක් මගින් මධ්‍යම පළාතේ ජන අනුපාතයට අනුවය. එහිදී සිංහල සිසුන් එකසිය විස්සක්, දමිල සිසුන් විසිඅටක් හා මුස්ලිම් සිසුන් දෙළහක් වශයෙන් සිසුන් එකසිය හැටක් 06 ශ්‍රේණියට ඇතුළත් කරගන්නා අතර මේ වන විට සිසුහු එක්දහස් දෙසීයක් පමණ සිප්සතර හදරති. ගුරු මණ්ඩලය බඳවා ගැනීමද විශේෂ තෝරා ගැනීමක් යටතේ සිදුවන අතර වර්තමානයේ සියදෙනකුට ආසන්න ඇදුරු මඩුල්ලක් සිටිති.


විදුහල්පති
රංජිත් රාජපක්ෂ

සමාරම්භක විදුහල්පතිවරයා වූයේ එස්. එම්. කීර්තිරත්න මහතා පාසලේ නාමය ඉහළින් ඔසවා තැබීමට පදනම දැමීය. ඉන් අනතුරුව විජේරත්න වීරසූරිය මහතා, ඒ.කේ. දිවාරත්න මහත්මිය, ටී සී. කීර්තිරත්න, එස්.එම්. එම්.ජී අබේරත්න, ඊ.එම්. අබේසේකර, කේ.ඩබ්.ඩී.යූ. චන්ද්‍රකුමාර යන සැමදෙනා රණබිම නාමය ඉහළින්ම ඔසවා තැබීමේ පෙර ගමන්කරුවෝ වූහ. වර්තමාන නියමුවා කර්නල් රංජිත් රාජපක්ෂය. එතුමා පාසලේ ගමන් මග විශිෂ්ටත්වය කරා යොමු කරමින් ශාස්ත්‍රීය අධ්‍යාපනය හා විෂය සමගාමී කටයුතුවල දී සුවිශේෂ ජයග්‍රහණ දිනාගැනීමට සමත්වී ඇත. විශේෂයෙන් දරුවන්ගේ විනය, පෞරුෂ සංවර්ධනය හා සෞන්දර්යාත්මක හැකියාව වර්ධනයට මෙන්ම නවීන තාක්ෂණික මාධ්‍යයන් භාවිතවන තරගවලින් කැපී පෙනෙන දක්ෂතා දක්වා ඇත. නව විශිෂ්ට ව්‍යවහාර ලෙස සිසු විරු පවුර, රන්පැය, රණබිම අරුණලු පාදචාරිකා, මුහුණු පොත වැනි නව්‍ය වැඩසටහන් මෙන්ම ගුරු පවුර හා දෙමාපිය පවුර ලෙස ප්‍රජාව හා කාර්ය මණ්ඩලය ද ඒකරාශි කර ඇත. අපොස සා.පෙළ හා උසස් පෙළ ශ්‍රේණි මට්ටමින් "රන් දවස" උපදේශන වැඩසටහන් හා ප්‍රජා සෞන්දර්යාත්මක වැඩසටහන් මගින් පාසලේ පවිත්‍රතාව හා භෞතික අඩුපාඩු සපුරා ගැනීම ද සුවිශේෂ වේ. විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම්ලත් සිසුන් ලවා අනෙකුත් සිසුන්ට මාර්ග උපදේශන වැඩසටහන් පැවැත්වීම, ආර්ථික අපහසුතා ඇති දරුවන්ට නොමිලේ ආහාර හා නේවාසික පහසුකම් ලබාදීම වැනි සමාජ සුබසාධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක වේ. ලංකාවේ පිරිමි පාසල් අතර ප්‍රථම ස්ථානය දිනා ගනිමින් අපොස සා.පෙළ සමත් ප්‍රතිශතය සියයට සියයක් හිමිකරගෙන ඇති අතරම සමස්ත පාසල් අතර දිවයිනේ මුල්ම ස්ථානවල රැඳී ඇත. සිංහල දෙමළ මුස්ලිම් ජාතීන් මනා සහයෝගයෙන් හා සංහිඳියාවෙන් කටයුතු කිරීම ද මෙම පාසලේ විශේෂත්වයකි.


බටහිර තූර්යවාදන කණ්ඩායම


දෙමළ මාධ්‍යය සමස්ත ලංකා පාසල් කර්නාටික් සංගීත නාට්‍ය තරගාවලිය

මෑත කාලයේ සා.පෙළ ප්‍රතිඵලවලින් මහනුවර කලාපයේ පළමු ස්ථානය ද උසස් පෙළ විද්‍යා, ගණිත, වාණිජ අංශවලින් වැඩිම පිරිසක් විශ්වවිද්‍යාල වරම් දිනා ගැනීමට හැකි වී තිබේ. පසුගිය වසර 25 තුළ වෛද්‍යවරුන් ඉංජිනේරුවන් විවිධ ක්ෂේත්‍රවල විධායක නිලධාරීන් පමණක් නොව ආරක්ෂක ක්ෂේත්‍රයේ හා නීති ක්ෂේත්‍රයේ විශාරදයන් ජාතියට දයාද කිරීමට හැකිවීම පාසල ලද ජයග්‍රහණයකි. මෑත කාලය තුළ පාසල ලබා ඇති ජයග්‍රහණ අතර අවුරුදු 16 පහළ සමස්ත ලංකා බේස්බෝල් ශූරතාව දිනා ගැනීමට සමත් වූ අතර පාසලේ ක්‍රීඩකයන් පස් දෙනෙකුට චීනයේ පැවැත්වුණු බේස්බෝල් තරගාවලියේ දී ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම් නියෝජනය කිරීමට අවස්ථාව ලැබීම, ඉලක්කයට වෙඩි තැබීමේ සමස්ත තරගයේ දී ක්‍රීඩකයන් හත්දෙනෙක් ශ්‍රී ලංකා වර්ණ දිනා ගැනීමට සමත්වීම හා වැඩිම ක්‍රීඩකයන් පිරිසක් නියෝජනය කළ පාසල බවට වීම, මෑතකදී තායිලන්තයේ පැවැත්වූ අන්තර් ජාතික වුෂු තරගාවලියේ දී රන් පදක්කම් දිනා ගැනීම ප්‍රධාන වේ. ක්‍රීඩාව මෙන්ම සෞන්දර්ය අංශයෙන්ද දක්ෂතා පෙන්වීම මෙම පාසලේ තවත් විශේෂයකි. පෙරදිග සංගීතය, 2022 තරගය කව්වාලි- ඒකල ගායන කලාප හා පළාත් ප්‍රථම, සමස්ත ලංකා දෙවන ස්ථානය. රාගධාර සිතාර් වාදන - ජ්‍යෙෂ්ඨ ඒකල කලාප ප්‍රථම ස්ථානය, පළාත් දෙවන ස්ථානය. 2023 සමස්ත ලංකා සංගීත තරග- ජ්‍යෙෂ්ඨ ඒකල ගසල් ගායනය කලාප ප්‍රථම ස්ථානය, ගී අනුවාදනය (වයලීන් ) ජ්‍යෙෂ්ඨ විවෘත කලා ප්‍රථම ස්ථානය. රාගධාරී සිතාර් වාදනය ජ්‍යෙෂ්ඨ ඒකල කලාප ප්‍රථම, රාගධාරි එස්රාජ් වාදනය කනිෂ්ඨ ඒකල කලාප ප්‍රථම ස්ථාන දිනාගන්නා ලදී. නර්තන අංශයේ කලාප ජයග්‍රහණය සමගින් පළාත් ප්‍රථම ස්ථානය දිනාගැනීම, 2022 නත්තල් කැරොල් ගායනා දෙමළ මාධ්‍යය (රූපවාහිනී) තරගාවලිය 2023 සමස්ත ලංකා පාසල් කර්නාටක සංගීත නාට්‍ය තරගාවලිය තුන්වන ස්ථානයද දිනාගෙන ඇත. මහනුවර කලාප ඔලිම්පියාඩ් ගණිත තරගාවලියේ තරග අංශ තුනෙන්ම සියලු පාසල් අබිබවා පළාත් ප්‍රථම ස්ථානය දිනා ගැනීමද සුවිශේෂ ජයග්‍රහණයකි. එමෙන්ම පාසලේ තිරසාර සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස ලබා ගත් ජයග්‍රහණ අතර 2018 මධ්‍යම පළාත් එලදයිතා සම්මානය තුන්වන ස්ථානය , 2018 සමස්ත ලංකා ඵලදයිතා කුසලතා සම්මානය, 2020 සමස්ත ලංකා ඵලදයිතා සම්මානය තුන්වන ස්ථානය ද වේ. විදුහල්පතිතුමා, ආචාර්ය මණ්ඩලය මෙන්ම දෙමාපියන්, ආදි ගුරු භවතුන් හා කීර්තිමත් ආදි ශිෂ්‍යයන් විද්‍යාලයේ දියුණුවට ඉමහත් ශක්තියකි. පන්ති කාමර, ක්‍රීඩාංගණය, ගෘහස්ථ ක්‍රීඩාංගණය, විද්‍යාගාර, පරිගණක විද්‍යාගාර, විදුහල්පති හා ගුරු නිවාස, නේවාසිකාගාර ආදී සියලු පහසුකම් රණබිම රාජකීය විද්‍යාලය සතුය. ලංකාවේ පාසල් පද්ධතිය තුළ හරිත පසුබිමක පිහිටි සුවිශේෂ විද්‍යස්ථානයක් ලෙසද රණබිම විද්‍යාලය කැපී පෙනේ.



6 ශ්‍රේණියට පිළිගැනීම

▼ මහේන්ද්‍ර රන්දෙණිය


බේස්බෝල් කණ්ඩායම


මාධ්‍ය දිනය දා


තාරකා විද්‍යා කමිටුව




දැල්පන්දු ලෝක කුසලානය 2023

# පරාජයන් තුනකින් ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට වැට

දකුණු අප්‍රිකාවේදී පැවැත්වෙන දැල්පන්දු ලෝක කුසලාන තරගාවලියේ වේල්සය සමගින් පැවැති තරගය ලකුණු 68-56 ක් ලෙස පරාජයට පත්වන්නට ශ්‍රී ලංකාවට සිදුවිය.

උණුසුම් මුහුණුවරක් ගත් මෙම තරගයේ පළමු කාර්තුව ලකුණු 17-11ක් ලෙස පෙරමුණ ගන්නට වේල්සය සමත් විය. දෙවැනි කාර්තුවේදී වේල්සයට කරට කර සටනක් දෙන්නට ශ්‍රී ලංකාව සමත් වූ අතර එම කාර්තුව අවසන් වූයේ ලකුණු 13-11ක් ලෙස ශ්‍රී ලංකාව පසුපසින් සිටිමිනි.

ඒ අනුව තරගයේ පළමු අර්ධය අවසන් වනවිට ලකුණු පුවරුව 30-22ක් ලෙස දැක්විණි. තරගයේ තෙවැනි අර්ධයේදී නැවත ආක්‍රමණශීලි තරග රටාවකට අවතීර්ණ වූ ශ්‍රී ලංකාව එම කාර්තුව ලකුණු 20-18ක් ලෙසින් වේල්සයට දැඩි අභියෝගයක් එල්ල කළේය. එලෙසින්ම ක්‍රියාත්මක වූ අවසන් කාර්තුවේදී ද සිය පරතරය එලෙසින්ම පවත්වා ගන්නට ශ්‍රී ලංකාව සමත් විය. එම කාර්තුව අවසන් වූයේ ලකුණු 18-16ක් ලෙසිනි. නමුත් පළමු කාර්තුවේදී වූ ලකුණු පසු බැසීම සහ සෙසු කාණ්ඩ වලදී වූ ලකුණු 2ක බැගින් වූ පරතරය හේතුවෙන් වේල්සයේ ජය තහවුරු විය.

මෙවර "සී" කාණ්ඩය යටතේ ශ්‍රී ලංකාව තරග වැදුණු අතර එහි සෙසු තරග වලදී ද සත්කාරක දකුණු අප්‍රිකාව හමුවේ සහ ජැමෙයිකාව හමුවේ ශ්‍රී ලංකාව පරාජයට පත්විය.

ලෝක ශ්‍රේණිගත කිරීම් හි මුල් ස්ථාන අතරෙහි පසුවන ජැමෙයිකාව ශ්‍රී ලංකාවට එරෙහිව ලකුණු 105-25 ක දැවැන්ත ජයග්‍රහණයක් වාර්තා කළේය. ඉන් අනතුරුව සත්කාරක දකුණු අප්‍රිකාව හමුවේ ශ්‍රී ලංකාවට ලකුණු 87-32ක පරාජයක් අත්විඳින්නට සිදුවිය.

මෙම පරාජයත් සමගින් ශ්‍රී ලංකාව අර්ධ අවසන් වටය සඳහා සුදුසුකම් නොලැබූ අතර ශ්‍රේණිගත කිරීම් තරග සඳහා සහභාගී වනු ඇත.




කාලිංග කුමාරගේ



ජායාරූප - සිලෝන් ඇත්ලැටික්ස්

කිශෝර් කුමාර්

# විසි තුන් වසරක වාර්තාවක් කාලිංග බිඳ හෙළයි

## ඉන්දියාවේ කිශෝර් කුමාර්ගෙන් කැපී පෙනෙන දස්කම්

ඉන්දියාව සහ මාලදිවයින ආරාධිතයන් ලෙසින් සහභාගී වූ 101 වැනි ජාතික මලල ක්‍රීඩා ශූරතාවේදී නව ශ්‍රී ලංකා වාර්තා 2ක් සහ නව තරගාවලි වාර්තා 4 ක් බිහි කරන්නට ශ්‍රී ලංකා ක්‍රීඩකයෝ සමත් වූහ.

තරගාවලියේ බිහිවූ ශ්‍රී ලංකා වාර්තා බිහිකළ ක්‍රීඩකයන් අතර මීටර 110 කඩුලු මතින් දිවීමේ ඉසව්වේදි ජනිඳු ලක්විජය විශේෂය. ජනිඳු සිය මූලික වටයේ ඉසව්වේදී තත්පර 13.77ක දක්ෂතාවක් වාර්තා කරමින් ශ්‍රී ලංකා වාර්තාව අලුත් කළ අතර ඉන් පැය 24ක් ගතවන්නටත් මත්තෙන් එහි අවසන් තරගයේදී තත්පර 13.72ක දක්ෂතාවක් දක්වමින් නැවත ශ්‍රී ලංකා වාර්තාව අලුත් කළේය.

ජවන ඉසව් අතර ශ්‍රී ලංකාවේ සුවිශේෂී ඉතිහාසයක් ඇති පිරිමි මීටර 400 ඉසව්වේ නව තරග වාර්තාවක් බිහි කරන්නට කාලිංග කුමාරගේ සමත් විය. ඒ මීටර 400 ඉසව්ව තත්පර 45.07කින් අවසන් කරමිනි. මෙය වසර 23ක තරගාවලි වාර්තාවක් අලුත් කිරීමක් වූ අතර එය ශ්‍රී ලංකාවේ ධාවන පථයක මීටර 400 ඉසව්ව සඳහා වාර්තා වූ හොඳම කාලය විය. මෙය ශ්‍රී ලංකාවේ හිටපු කෙටිදුර ධාවන ශූර සුගත් තිලකරත්නට පමණක් දෙවැනි වන අතර එය 2023 වසරේදී ආසියානුවෙකු වාර්තා කළ තුන්වැනි හොඳම දක්ෂතාව ද වේ. මේ අතර අරුණ දර්ශන මීටර 400 ඉසව්වෙන් සිය හොඳම කාලය ලෙස තත්පර 45.45 ක කාලයක් වාර්තා කළේය. මෙම තරගාවලියේ මීටර 400 ඉසව්වේම මූලික වටයේ තරගයකින් රාජිත රාජකරුණා තත්පර 45.98ක කාලයක් වාර්තා කිරීම කැපී පෙණිනි.

තරගාවලියේ පිරිමි හෙල්ල විසි කිරීමේ ඉසව්වේදී ඉන්දීය ක්‍රීඩක කිෂෝර් කුමාර් මීටර 84.38ක දක්ෂතාවක් දක්වමින් ලෝක මලල ක්‍රීඩා ශූරතාවට සුසුදුසුකම් ලැබීමේ ලැයිස්තුවේ ඉදිරියට පැමිණියේය. එය ශ්‍රී ලංකාවේ තරගාවලියක හෙල්ල විසි කිරීමෙන් දැක්වූ හොඳම දක්ෂතාව විය.

තරගාවලියේ විශේෂතම ඉසව්ව වූ මීටර් 400x4 පිරිමි ඉසව්ව ඊයේ (30 වැනිද) පැවැති අතර එහි රිදී පදක්කමින් සෑහීමකට පත්වන්නට ශ්‍රී ලංකාවට සිදුවිය. නමුත් මේ වනවිට ලෝක ශ්‍රේණිගත කිරීම් හී 12 වැනි ස්ථානයෙහි පසුවන ශ්‍රී ලංකාවට ශ්‍රේණිගත කිරීම් අතුරින් එළැඹෙන 19 වැනිද හංගේරියාවේ බුඩාපෙස්ට් හි ඇරඹෙන ලෝක මලල ක්‍රීඩා ශූරතාවේ මීටර 400x4 සහය දිවීමේ ඉසව්ව සඳහා සුදුසුකම් ලැබීමේ ඉඩකඩක් පවතී.




කාලිංගගේ වාර්තාගත ධාවනය

මෙවර තරගාවලියේ විශිෂ්ටතම විසිකිරීමේ ක්‍රීඩකයාට හිමි සම්මානය ඉන්දියාවේ කිෂෝර් කුමාර්ට හිමි වූ අතර තරගාවලියේ දක්ෂතම කෙටිදුර ක්‍රීඩිකාවට හිමි සම්මානය ඉන්දියාවේ සෝනියා බයිෂ්‍යාට හිමිවිය.

තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය කාලිංග කුමාරගේ විසින් දිනා ගත් අතර දක්ෂතම ක්‍රීඩිකාව ලෙසින් ගයන්තිකා අබේරත්න සම්මාන ලැබීය.

මෙම තරගාවලියත් සමගින් ලෝක මලල ක්‍රීඩා ශූරතාව සඳහා වන සුදුසුකම් ලැබීමේ කාල පරාසය අවසන් වනු ඇත.

# ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් වසන්තය ඇරැඹේ

■ ඇසළ තාරුක ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේ සිට



ඡායාරූපය - ක්‍රිෂාන් කාරියවසම්

සිව්වන වතාවට පැවත්වෙන ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ සමාරම්භක උළෙල ඊයේ (30) කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේදී පැවත්විණි. සමාරම්භක උළෙල සඳහා දිවයිනේ ප්‍රසිද්ධ කලාකරුවන් කිහිප දෙනෙකුද එක් වී තිබුණි.

මෙවර ලංකා ප්‍රිමියර් ලීගය සඳහා විදෙස් ක්‍රීඩකයින් තිස් එක් දෙනෙකු සහභාගී වන බවට වාර්තා වී ඇත. මෙම ක්‍රීඩකයින්ගෙන් දහතුන් දෙනෙක් පාකිස්තාන ජාතික ක්‍රීඩකයින් වන අතර ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව සහ බංග්ලාදේශය නියෝජනය කරමින් ක්‍රීඩකයින් හතරදෙනා බැගින් මෙවර තරගාවලියට සහභාගී වනු ඇත. ඇෆ්ඝනිස්තාන ජාතික ක්‍රීඩකයින් තිදෙනෙකු, නවසීලන්ත ජාතික ක්‍රීඩකයින් දෙදෙනෙකු සහ එක් සිම්බාබ්වේ ජාතික ක්‍රීඩකයෙකුද මෙවර තරගාවලියට සහභාගී වීමට නියමිතයි.

තරගාවලිය සඳහා මෙවරත් කණ්ඩායම් 5ක් සහභාගී වන අතර කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේදී සහ මහනුවර පල්ලේකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී තරග පැවත්වීමට කටයුතු සූදානම් කොට ඇත. තරගාවලිය ජූලි මස 30 සිට අගෝස්තු මස 20 දින දක්වා පැවත්වේ.

# බෙන්සීනාගේ හිජාබය ඉතිහාස ගතවේ



කාන්තා ලෝක කුසලාන තරගාවලියේ පළමු වටයේ 'එච්' කාණ්ඩයේ තරගයකදී හිජාබයක් පැළඳ ක්‍රීඩා කරමින් වාර්තාපොත් අතරට එක්වන්නට මොරොක්කෝ ආරක්ෂක ක්‍රීඩිකා නෞහාලියා බෙන්සීනා සමත් වූවාය.

මීට පෙර ජාත්‍යන්තර සහ ක්‍රීඩා සමාජ තරගවලදී ක්‍රීඩිකාවන් හිජාබයන් පැළඳ ක්‍රීඩා කළ අවස්තා තිබුණද කාන්තා පාපන්දු ලෝක කුසලාන ඉතිහාසයේ මෙම සිදුවීම වාර්තා වූයේ පළමු වරටය.

දකුණු කොරියාව සහ මොරොක්කෝව අතර පැවති තරගයේ මෙම සිදුවීම වූ අතර තරගයේ ජයග්‍රහණය මොරොක්කෝවට 1-0ක් ලෙසින් හිමි විණි.

# උතුරු මැද පළාත් විවෘත බැඩ්මින්ටන් ශූරතාවලියට අයැදුම්පත් කැඳවේ

උතුරු මැද පළාත් බැඩ්මින්ටන් සංගමය විසින් සංවිධාන කරනු ලබන උතුරු මැද පළාත් සමස්ත ලංකා විවෘත බැඩ්මින්ටන් ශූරතාවලිය සඳහා අයැදුම්පත් කැඳවීම මේ දිනවල සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා බැඩ්මින්ටන් ආයතනයේ අනුමැතිය යටතේ මේ ශූරතාවලිය අගෝස්තු මස 28 වැනිද සිට සැප්තැම්බර් මස 3 වැනිද දක්වා අනුරාධපුර පළාත් ගෘහස්ත ක්‍රීඩාගාරයේ සහ මයික් කුක් ගෘහස්ත ක්‍රීඩාගාරයේදී පැවැත්වීමට නියමිතය. මේ සඳහා අයැදුම්පත් ශ්‍රී ලංකා බැඩ්මින්ටන් ආයතනයේ නිල වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

මේ ශූරතාවට කාන්තා හා පිරිමි ඒකල, යුගල හා මිශ්‍ර යුගල විවෘත තරග, අවුරුදු 11න් පහළ කණිෂ්ඨ බාලක බාලිකා ඒකල තරග, අවුරුදු 13න් පහළ සිට අවුරුදු 19න් පහළ දක්වා බාලක බාලිකා ඒකල හා යුගල තරග, අවුරුදු 30ට ඉහළ වයස් කාණ්ඩයේ සිට අවුරුදු 70ට ඉහළ වයස් කාණ්ඩය දක්වා කාන්තා හා පිරිමි ඒකල, යුගල, මිශ්‍ර යුගල තරග සමඟ පළඟ ශූරතාව සඳහා කාන්තා හා පිරිමි ඒකල පරාජිතයන් අතර තරග පැවැත්වීමට නියමිතය.




# ජාතික පාපන්දු කණ්ඩායමට යළි පණ දීම 15 දා?

QR කේතය ස්කෑන් කර පුවතේ වීඩියෝව නරඹන්න

එළැඹෙන අගෝස්තු 14වැනිද පැවැත්වෙන මහා සභා රැස්වීමෙන් අනතුරුව ජාතික පාපන්දු කණ්ඩායමේ ක්‍රීඩකයන් පුහුණුවීම් සඳහා කැඳවීමට තීරණය කර ඇතැයි පාපන්දු සම්මේලනයේ හිටපු සභාපති ජස්වාර් උමාර් පැවසුවේය.

ඒ පෙරේද (29 වැනිද) බැද්දගාන පාපන්දු නිවසේදී ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය විසින් පනවා ඇති තහනම ඉවත් කිරීම සම්බන්ධයෙන් වූ පළමු සාකච්ඡාවේදී අදහස් දක්වමිනි.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවේ පාපන්දු ලීග අතරින් සියයට 95කට ආසන්න සංඛ්‍යාවක නියෝජිතයන් සහභාගී වූ අතර, ශ්‍රී ලංකා පාපන්දු වෙත පනවා ඇති තහනම ඉවත් කර ගැනීමේ ජාතික අවශ්‍යතාව මත මෙතෙක් ප්‍රති පක්ෂව කටයුතු කළ සියලු පාර්ශව එක්වී කටයුතු කිරීමට එහිදී ඒකමතිකව තීරණය කෙරිණි. ඒ අනුව ඉදිරි රැස්වීමේදී නිලවරණය පැවැත්වෙන දිනයක් සහ නිලවරණ අපේක්ෂකයන් සම්බන්ධයෙන් තීරණයක් ගනු ඇත. මෙය ශ්‍රී ලංකාව සහ යේමනය අතර ලෝක කුසලාන සුදුසුකම් ලැබීමේ වටයේ පැවැත්වෙන පළමු තරගයට දින 10කට පෙර අදාළ නිලධාරි මණ්ඩල පත් කිරීම පිළිබඳව තීරණය කළ යුතු බව සඳහන් විය.

ලෝක කුසලාන සුදුසුකම් ලැබීමේ වටය යටතේ ශ්‍රී ලංකාව සහ යේමනය අතර පැවැත්වෙන තරගය ජයග්‍රහණය ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය වුවද ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය ලැබෙනුයේ ලබන 14 වැනිද පැවැත්වෙන මහා සභා රැස්වීමෙන් පසුව බව හිටපු සභාපති ජස්වාර් උමාර් පැවසුවේය. එහිදී 'අරුණ' මාධ්‍යවේදියා විදෙස් සම්භවයක් ඇති ක්‍රීඩකයන් කැඳවීම සහ ඔවුන්ගේ ද්විත්ව පුරවැසිභාවය සම්බන්ධයෙන් නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දුන් ජස්වාර් ' ඇත්තටම ලංකාවට විදෙස් ක්‍රීඩකයන් අත්‍යවශ්‍යයි. ඒ අය අතරින් කිහිප දෙනෙකුගේ ලේඛන හදන ගමන් තියෙන්නේ. නමුත් මේ වෙලාවෙදි අපිට ඒ ගැන හොයන්න බලයක් නෑ. ඒක 14 වෙනිදයින් පස්සෙ තමයි පුලුවන්' යි පැවසුවේය.

එම ප්‍රශ්නයටම පිළිතුරු දුන් හිටපු පාපන්දු විධායක මණ්ඩල සභික වෛද්‍ය මනිල් ප්‍රනාන්දු' විදෙස් ක්‍රීඩකයන්ගේ සහභාගීත්වය අත්‍යවශ්‍යයි. මේක ඉක්මනින්ම කරන්න ඕනේ. නමුත් ඒ එන ක්‍රීඩකයන්ට අවශ්‍ය රක්ෂණාවරණ වගේ පහසුකම් ගැන කතාබහ කරමින් ඉන්නේ' යි පැවසුවේය.

ඒ අනුව බොහෝවිට ජාතික පාපන්දු කණ්ඩායමේ පුහුණුවීම් එළැඹෙන 15 වැනිද ආරම්භ වනු ඇතැයි විශ්වාසවන්ත ආරංචි මාර්ග සඳහන් කර සිටී.

## ඒ ගොල්ලෝ ඔක්කොම යාළුවෝ මල්ලී!😂😂




කලක් පාපන්දු පරිපාලනයේ දැඩි එදිරිවාදීන් ලෙසින් සිටි ජස්වාර් උමාර්,(වමේ) රංජිත් රොද්‍රිගු (මැද) සහ වෛද්‍ය මනිල් ප්‍රනාන්දු (දකුණේ) අදාළ සාකච්ඡාවේදී අත්වැල් බැඳගෙන.....

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින් මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

01 වැනි පිටුවෙන්...

## ඇඟිලි සලකුණු මැෂිමෙන්...

ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය අත්හිටුවන ලෙස ජනාධිපතිවරයා ජනාධිපති කාර්යාලය ප්‍රධානී සාගල රත්නායකට දැනුම් දුන් බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මාධ්‍ය ප්‍රකාශක වෛද්‍ය චමල් විජේසිංහ 'අරුණ' කළ විමසුමකදී පැවැසුවේය.

මෙම සාකච්ඡාවෙන් පසු රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපතිවරයා සහ ලේකම්වරයා මෙම තීරණය පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉහළ නිලධාරීන් දැනුවත් කර තිබේ. කෙසේ වෙතත් 'අරුණ' කළ විමසුමකදී සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත ප්‍රකාශ කළේ මුදල් අමාත්‍යාංශ තීරණයකට අනුව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කිරීම වෛද්‍යවරුන්ට අනිවාර්ය කළ බවයි. එහෙත් එම තීරණය අත්හිටුවීමේ නියෝගයක් මෙතෙක් අමාත්‍යාංශයට නොලැබුණු බවද ඔහු අවධාරණය කර සිටියේය.

අගෝස්තු මස පළමුවැනිද සිට මෙම තීරණය ක්‍රියාත්මක බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) ගීතාමනී කරුණාරත්න යොමු කළ අභ්‍යන්තර ලිපියක සඳහන් වෙයි. සියලුම අතිරේක ලේකම්වරු, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රධාන මූල්‍ය නිලධාරියා වෙත මෙම ලිපිය යොමුකර තිබුණි.

මෙම නිලධාරීන්ට අගෝස්තු මස පළමුවැනි දින සිට අතිරේක රාජකාරි දීමනා හිමිවන්නේ ඇඟිලි සලකුණු යන්ත්‍රද පරීක්ෂාවට ලක්කිරීමෙන් අනතුරුව බව සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුම් දී තිබුණේය.

මේ ආකාරයට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය පරිපාලන සේවා නිලධාරීන්ට හා විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට ඇඟිලි සලකුණු යන්ත්‍ර අනිවාර්ය කිරීමේ තීරණය යහපාලන ආණ්ඩුව සමයේදී ක්‍රියාත්මක කිරීමට තීරණය විය. එහෙත් වෛද්‍යවරුන්ගේ දැඩි බලපෑම මත එම තීරණය නතර කිරීමට එවකට සෞඛ්‍ය ලේකම් ලෙස ක්‍රියාකළ අනුර ජයවික්‍රමට සිදුවිය. යහපාලන ආණ්ඩු සමයේදී ඇඟිලි සලකුණු යන්ත්‍ර තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා මිලදී ගත් යන්ත්‍ර විස්සක් සෞඛ්‍ය අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ සවිකර තිබේ. වෛද්‍යවරුන් ප්‍රකාශ කරන්නේ සිය දිනපොත පාදක කරගනිමින් අතිරේක රාජකාරී දීමනා සකස් කළ යුතු බවයි.

## හොරු අල්ලන්න සවිකරපු....

අක්කර පහක්වූ මෙම වගා බිමේ භෝග නිතර සොරකම් කර තිබූ බවත් ඒ අනුව තමා ආරක්ෂිත කැමරා හයක් සහිත පද්ධතියක් සවි කළ බවත් ඔහු පොලිසියට කර තිබූ පැමිණිල්ලේ සඳහන්වේ. පසුව බලන විට වගා බිමේ ඇති නිවසේ දෙරටුව විවෘත කොට තිබූ බවත්, රුපියල් 15,000ක් වටිනා කැමරා දෙකක්, රුපියල් 40,000 දහක් වටිනා ඩීවීආර් යන්ත්‍රයක්, රුපියල් 30,000ක් දහක් වටිනා එල් ඊ ඩී මොනිටරයක්, රුපියල් 7000/ ක් වටිනා විදුලි කේතලයක් හා රුපියල් 6000/ක් වටිනා රයිස් කුකරයක්ද අතුරුදන්ව තිබූ බවත් සොරකම් කර ඇති භාණ්ඩවල මුළු වටිනාකම රුපියල් 98,000ක් බවත් ඔහු තම පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

තිනියාවල පොලිසිය මේ පිළිබඳව වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

## නටන්න නැතිව....

මෙම ආසන බලමණ්ඩල රැස්වීම ආරම්භ වූයේ පාක්ෂිකයන් උත්සව ශාලාවේ නටමින් ගයමින් විනෝද වීමෙන් පසුවය. පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උපසභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන් විජයලාල් ද සිල්වා ද පාක්ෂිකයන් සමග එක්ව නර්තනයේ යෙදුණු අතර හිටපු ජනාධිපතිවරයා ඒ සම්බන්ධයෙන් සිය සතුට පළ කළේය.

ඉන්පසු සභාව අමතමින් ඔහු මෙසේද කීවේය

මම පිටරට යන විට මගේ පුටුව බාර දීලා ගියේ ශාන් විජේලාල්ටයි. ඔහු මගේ පැරණිතම හිතවතෙක්. අද දින මේ මහා සමුළුවෙ නර්තනය ඉදිරිපත් කරන විට පාක්ෂිකයන් වැඩිහිටි කාන්තාවන් ඇතුළු පිරිසක් ලස්සනට නැටුවා. මටත් එතනට ගිහින් නටන්න පුදුම ආශාවක් තිබුණා. ඒත් මම ඒ අය සමග නටන්න එතනට ගියේ නෑ. ගියානම් හෙට උදේට මාධ්‍ය හා සමාජ මාධ්‍ය මගින් මා පතුරු ගහලා අවසන් කරලා තියේවි. ඒක මම දන්න නිසා එහෙම කළේ නෑ.

ගාල්ලේ ජනතාවට අපි දේශපාලනය උගන්නන්න ඕන නෑ. ඒ අය අපිට දේශ දේශපාලනය උගන්නාවි. ඒක මම දන්නවා. මහා සටන් කාමීන් පිරිසක් දකුණු පළාතේ ඉන්නේ.

මීට පෙර 2010 වසරෙ මහින්ද රාජපක්ෂ ගේ ඉල්ලීම පිට පක්ෂ ක්‍රියාකාරීන් හමුවෙන්න මම ගාල්ලට ආවා. එද අපේ අපේක්ෂකයන් පිළිබඳ ජනතාව වාග් ප්‍රහාර එල්ල කළා. ඕවට මාව අල්ල ගන්න එපා කියලා මම එද යන්තමින් බේරිලා ගියා.

අද දරුවන් නොගැළපෙන දේට යොමු වෙලා. ගම්පහ පැත්තේ පාසලක කුඩු අල්ලන්න එස්.ටී.එෆ්. දන්න සිද්ධ වුණා. පාසල් පද්ධතිය ගත්තම කොළඹ සිට ගමට යන තෙක්ම ඛේදනීය තත්ත්වයට පත්වෙලා. අපේ දරුවන්ට මෙසේ කොතෙක් දුරට යන්න දෙනවද කියලා අපි සොයා බැලිය යුතුයි.






# මිල සංශෝධනයක් අපේක්ෂාවෙන් ෂෙඩ්වලට තෙල් ඇණවුම් කර නැහැ

**- විදුලිබල ඇමැති**

ජයසිරි පේදුරුආරච්චි - මාතර

ඉන්ධන මිල සංශෝධනයක් බලාපොරොත්තුවෙන් ඇතැම් ඉන්ධනහල් අවශ්‍ය තරම් තොග පවත්වා ගෙන යාමට අපොහොසත් වී ඇති බව විදුලිබල අමාත්‍ය කංචන විජේසේකර පැවසීය.

ඒ අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් පාලනය කරන ඉන්ධන පිරවුම්හල් 101ක පෙට්‍රල් ඔක්ටේන් 92 සහ පිරවුම්හල් 61ක ලංකා ඔටෝ ඩීසල් සියයට 50ක අවම තොග පවත්වාගෙන යාමට අපොහොසත් වී ඇති අතර ප්‍රමාණවත් තොග පවත්වාගෙන යාමට අවශ්‍ය ඉන්ධන පෙරේද (29 වැනිද) දිනයේ ඇණවුම් කර නොමැති බවද ඇමැතිවරයා සඳහන් කළේය.

මේ අකාරයෙන් නිසි පරිදි ඉන්ධන තොග පවත්වාගෙන යාමට අපොහොසත් වූ ඉන්ධන පිරවුම්හල් කීපයක පාලනය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතට ගැනීමට සහ අනෙකුත් පිරවුම්හල්වලට එරෙහිව අවශ්‍ය නීතිමය පියවර ගැනීමට පසුගිය මස කටයුතු කළ බවද ඇමැතිවරයා සඳහන් කරයි.

කෙසේ වෙතත් ඊයේ (30 වැනිද ) දින උදෑසන 8.30 වනවිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව පවතින ඉන්ධන තොග ලංකා ඔටෝ ඩීසල් මෙට්‍රික් ටොන් 124,690, සුපිරි ඩීසල් මෙට්‍රික් ටොන් 5,651, පැට්‍රල් 92 මෙට්‍රික් ටොන් 19,903, පැට්‍රල් 95 මෙට්‍රික් ටොන් 4,537, ගුවන්යානා ඉන්ධන මෙට්‍රික් ටොන් 26,539 ලෙස සඳහන් වී තිබිණි .

01 වැනි පිටුවෙන්...

## රට යන තරුණයන් බියවද්දා....

ආරක්ෂක අමාත්‍යාංශයෙන් මේ සම්බන්ධව විමර්ශනය කරන ලෙසට මහජන ආරක්ෂක අමාත්‍යාංශයට වාර්තාවක් එවා ඇතැයි මහජන ආරක්ෂක අමාත්‍යාංශ ප්‍රකාශකයකු අරුණට පැවැසීය.

මෙම ආගමන විගමන නිලධාරියා සමග වූ සංවිධානාත්මක කණ්ඩායමට ගුවන් සේවා ආයතනවල නිලධාරීන්ද සම්බන්ධ බවට ඒමගින් චෝදනා ලැබී ඇත.

කොරියාවේ රැකියා සඳහා යාමට පැමිණි ශ්‍රී ලාංකික තරුණයන් ගුවන් ගතවීමට තිබූ ගුවන් යානා පවා ප්‍රමාද වී ඇත්තේ මෙම සංවිධානාත්මක කල්ලියේ ක්‍රියාව නිසා බවද දැනට ලැබී ඇති තොරතුරුවලින් කියැවේ.

ගුවන් තොටුපොළේ ලියකියවිලි පරීක්ෂා කර අවසන් කවුන්ටරය පසුකර ගුවන්ගත වීමට යන මොහොතේ තීරු බදු රහිත භාණ්ඩ විකුණන වෙළෙඳසල් ආසන්නයේදී තරුණයන් මෙම කල්ලියේ ග්‍රහණයට ගන්නා බව හෙළි වී තිබේ.

ආරක්ෂක අමාත්‍යාංශයේ සේවයේ නිරත හමුදා නිලධාරියකුගේ ඥාති පුතෙකුට මේ අයුරින් මෙම කල්ලිය විසින් බියවද්දා ඇමරිකන් ඩොලර් දෙසියයක් ලබාගැනීම සම්බන්ධයෙන් වූ පැමිණිල්ලකින් පසුව මෙම ජාවාරම අනාවරණය වී ඇත.

තීරුබදු රහිත භාණ්ඩ විකුණන වෙළෙඳසල් ආශ්‍රිත ප්‍රදේශයේ දී තමන් ආගමන විගමන නිලධාරීන් බව පෙන්වා තරුණයන් තුන්හතරදෙනකු එකවර ග්‍රහණයට ගන්නා බවත්, ඉන්පසුව ඔවු ඒ අසල කාර්යාලයකට රැගෙන ගොස් ගුවන් ගමන් බලපත්‍ර හා ටිකට්පත් මෙම නිලධාරීන් භාරයට ගන්නා බවත් තොරතුරු ලැබී ඇත.

ගුවන් යානය පිටත් වීමට ගුවන් මගීන් අමතා අවසන් සිහි කැඳවීම් කරන මොහොත වනතුරු මෙම පිරිස් රඳවාගෙන බියවද්දා අවසාන මොහොතේ ඩොලර් දෙසීය බැගින් ගෙන පිටත්කරන බව අනාවරණය වෙමින් ඇත.

කොරියාවට යාමට යන තරුණයන් සමග සංචාරක වීසාවලින් යාමට එන තරුණ කණ්ඩායම් මෙම කල්ලියේ වැඩිපුරම ඉලක්කය වී ඇතැයි තොරතුරු ලැබී ඇත. තායිලන්තයට සංචාරක වීසා මගින් ගොස් රටවල රැකියා සොයා යන තරුණයන්ද මෙම කල්ලියේ ඉලක්කය බවද පැවසේ.

කොරියාවට යන ගුවන් යානා ඇතුළුව ගුවන් යානා ප්‍රමාද වීමට හේතු වී ඇත්තේද මෙම සංවිධානාත්මක කණ්ඩායම් අවසන් මොහොත තෙක් ගුවන් මගීන් ප්‍රමාද කිරීම බව දැනට තොරතුරු ලැබී ඇත.

යළි ලංකාවට ඒමේදී කරදර වේයැයි බියෙන් මෙයට මුහුණ දෙන බහුතරය පැමිණිලි කිරීමට බිය වී ඇතැයි විමර්ශනවලදී දැනගන්නට ලැබී ඇත.

මෙම සංවිධානාත්මක කල්ලිය ගැන වැඩිදුර විමර්ශන මහජන ආරක්ෂක කටයුතු ඇමැති ටිරාන් අලස්ගේ උපදෙස් මත ඇරැඹීමට නියමිතය.

## පැවිල්ලෙ සැරට...

පාඩුව රුපියල් බිලියන 42කට ආසන්න බවත්, මේ නිසා සහල් ආනයනය කරන්නට සිදුවෙතැයි කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර පවසයි.

සමනල වැව ජලාශයෙන් උඩවලව ජලාශයට ජලය නිකුත් කළහොත් දකුණු පළාතට දිනකට පැය 01ත් 03ත් අතර කාලයක් විදුලිය කප්පාදු කිරීමට සිදුවන බව විදුලි බල මණ්ඩලය සඳහන් කර ඇත.

එමෙන්ම, වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් රත්නපුර සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල පවුල් 4,443 කට අයත් පුද්ගලයන් 14,712 ක් පීඩාවට පත්ව ඇතැයි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහන් කරයි.

සමනල වැව ජලාශයෙන් උඩවලව ජලාශයට ජලය සපයා ගැනීමට නොහැකිවීම නිසා මෙවර යල කන්නයේ වී වගා කරන ලද කුඹුරු අක්කර පනස් දහසක (50,000) වී වගාව විනාශවීමේ අවදානම් තත්ත්වයක් උද්ගතව තිබේ.

ජලය ප්‍රමාණවත් නොවීම නිසා ඉදිරි සතියක කාලය තුළ වී වගාවෙන් රුපියල් බිලියන 16.81ක අලාභයක්ද, නියඟය නිසා කෙසෙල් හා අනෙකුත් භෝග වගාවන්ට සිදුවන හානිය නිසා සමස්තයක් ලෙස රුපියල් බිලියන 30 ක පාඩුවක්ද සිදු විය හැකි බවත්, මේ වසරේ සහල් නිෂ්පාදනයට දැඩි බලපෑමක් එල්ල වීමේ අවදානමක් පවතින බවත් කෘෂිකර්ම ඇමැතිවරයා පවසයි.

දැනට පවතින නියඟය ඉදිරියේදී තවත් දරුණු අතට පත්වීමේ අවදානමක් පවතින බවත්, ඉදිරි මහ කන්නය අසාර්ථක වුවහොත් ඉදිරියේදී රටට ආහාර හිඟයක් ඇතිවිය හැකි බවත් කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර පැවසුවේය. ආහාර හිඟයක් සම්බන්ධව අනාවැකි පළකර තිබීම නිසා ඉන්දියාව සහල් අපනයනය නතර කර තිබෙන බැවින් එරටින් සහල් ලබා ගැනීමේ හැකියාවක් නොමැති බවද ඇමැතිවරයා පැවසීය.

සමනල වැවේ සිට උඩවළවේ ජලාශයට දින දහයකට සෑහෙන ජලය ප්‍රමාණයක් ලබා ගැනීම සම්බන්ධව කෘෂිකර්ම, මහවැලි, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශ නිලධාරීන් සමග කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර සාකච්ඡා කරනු ලැබූවද,එම සාකච්ඡා නිසි විසඳුමකින් තොරව අවසන්වී තිබේ. මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ජනාධිපතිවරයාද දැනුවත් කර තිබේ. උඩවලව ජලාශයෙන් ඇළ මාර්ගයක් කපා හෝ ගොවිජනතාවට ජලය සපයන ලෙස ජනාධිපතිවරයා එහිදී දැනුම්දී ඇත.

මෙහිදී ලංකා විදුලි බල මණ්ඩලයේ නිලධාරීන් පවසා ඇත්තේ මේ වන විට සමනල වැව ජලාශයේ ජල ධාරිතාව කියුබික් මීටර් මිලියන (MCM) 87.9 ක් දක්වා පහත බැස තිබෙන බවත්, උඩවලව ජලාශයට සමනල වැවෙන් දින දහයක් ජලය නිකුත් කළහොත් එම ජල මට්ටම කියුබික් මීටර් මිලියන 60 දක්වා පහත බැසීම නිසා දකුණු පළාතට පැය 01 ත් 3 ත් අතර කාලයක් විදුලිය කප්පාදු කිරීමට සිදුවන බවත්ය.

මෙහිදී විදුලිබල නිෂ්පාදනය අඩාළවීම නිසා සිදුවන පාඩුව රුපියල් බිලියන 1.6 ක් බවට ගණන් බලා ඇත.

ඉදිරි වියළි කාලගුණික තත්ත්වයට මුහුණ දීම සඳහා වගා කළ හැකි සෑම ස්ථානයකම කුමන හෝ ආහාර භෝගයක් වගා කිරීමට පියවර ගන්නා ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටින බවද ඇමැතිවරයා කීවේය.

## වකුගඩු අහිමි වූ....

අදාළ වකුගඩු සැත්කමෙන් අනතුරුව විෂබීජයක් ආසාදනය වීම නිසා රිජ්වේ ආර්යා ළමා රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටි අවුරුදු තුනයි මාස තුනක් වයසැති කොළඹ කොටහේන ප්‍රදේශයේ පදිංචි මුහම්මද් හම්දි හස්ලීම් නමැති දරුවා මෙසේ ජීවිතක්ෂයට පත්ව තිබුණි. දරුවාගේ දෙමාපියන් චෝදනා කරන්නේ දරුවාගේ අකර්මන්‍ය වූ වකුගඩුව සමග නිරෝගී වකුගඩුවත් වෛද්‍යවරුන් විසින් එළිත ඉවත් කොට ඇති බවයි. එය තමන් දැන ගත්තේ දරුවා නිවසට රැගෙන ගොස් මුත්‍රා පිට නොවීම නිසා දරුවා යළි රෝහල් ගත කර කළ පරීක්ෂාවෙන් අනතුරුව බවද ඔවුහු චෝදනා කරති.

2022 වසරේ දෙසැම්බර් මාසයේ මෙම සැත්කම සිදුකළ බවත්, දරුවාගේ නිරෝගී වකුගඩුව ඉවත් වූයේ අත්වැරදීමකින් බවට එම අවස්ථාවේ සැත්කම කළ වෛද්‍යවරයා පැවැසූ බවද මියගිය දරුවාගේ පියා වන මොහොමඩ් නසාර් පැවැසීය.

එමෙන්ම දරුවාට මාස හතරක් ඇතුළත වකුගඩුවක් සොයා බද්ධ කිරීමට පොරොන්දු වුවද, මාස හතක් යනතුරුත් එය සිදු නොවීමත්, ඒ අතරතුර කාලයේ රුධිර කාන්දුකරණ ප්‍රතිකාර සඳහා දරුවා යොමුකොට තිබේ. ඉකුත් මාස දෙකක පමණ කාලයක් දරුවා අඛණ්ඩව රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති අතර ඔහු දැඩි සත්කාර ඒකකයේදී ඉකුත් සිකුරාද (27) මියගොස් ඇත.

මේ සම්බන්ධයෙන් නැගෙන චෝදනාවන්ට පිළිතුරු දෙමින් රෝහල් අධ්‍යක්ෂවරයා මෙසේද පැවැසීය.

"මේ දරුවාගේ නරක් වූ වකුගඩුව අනෙක් වකුගඩුවට ඇළිලා වගේ තමයි පිහිටලා තියෙන්නේ. ඒ නිසා තමයි එය වෛද්‍යවරුන්ට සොයා ගැනීමට නොහැකි වී ඇත්තේ. මෙය හිතා මතා කළ දෙයක් නෙවෙයි. එහෙම වරදක් දරුවකුට වෛද්‍යවරයෙක් සිදුකරන්නේ නැහැ. ඒ වගේම මෙවන් දෙයක් රෝහල් තුළ මීට පෙර සිදුවෙලා නැහැ. මේ සැත්කම සිදුකළ වෛද්‍යවරයා මේ වනවිට පවුලේ සාමාජිකයන් සමග විදේශ ගතව සිටිනවා" යැයිද සඳහන් කළේය.

# දිනපොත

## යුදඟනාව ඇසළ මංගල්‍යයට කප්සිටුවීම

බුත්තල ඓතිහාසික යුදඟනාව රජමහා විහාරයේ 2023 ඇසළ මංගල්‍යයට කප්සිටුවීම අද (31 වැනිද) උදෑසන සුබ මොහොතින් සිදුකෙරේ.

01 වැනි පිටුවෙන්...

## වතුර ගැහුව කියලා....

පහරකෑමෙන් ඝාතනයට ලක්ව ඇත්තේ පාදුක්ක වටරැක සමනළ තැන්න පදිංචි ඔස්ටි නානායක්කාර නමැති එක්දරු පියෙකි. වැදගත් වෘත්තිකයෙකු වූ ඔහු මීට කලකට පෙර මානසික රෝගයකට ලක්ව ඇති බවත් රෝග තත්ත්වය උත්සන්න වීම නිසා ඔහු පසුගිය (20 වැනිද) අංගොඩ ජාතික මානසික සෞඛ්‍ය ආයතනය වෙත යොමුකර ඇති බවත් මුල්ලේරියාව පොලිසිය පවසයි.

එසේ රෝහල්ගත කළ ඔහු පසුගිය 25 වැනිද අලුයම නාන කාමරයේදී රෝහලේ සෞඛ්‍ය කාර්ය සහායකයන් වෙත වතුර ගසා තිබෙන බවත් ඊට උරණ වූ සෞඛ්‍ය කාර්ය සහායකයන් මෙම රෝගියාට අතින් පයින් සහ මොට ආයුධවලින් පහරදී තිබෙන බවත් දරුණු පහරකෑම්වලට ලක්ව රෝගියා මියගොස් තිබෙන බවත් පොලිසිය සඳහන් කරයි.

මෙම රෝගියා ඝාතනය වීමෙන් පසු නාන කාමරයේ ලිස්සා වැටීමෙන් මරණය සිදුව ඇති බවට රෝහල් බලධාරීන් විසින් ඥාතීන් වෙත දැනුම් දී තිබෙන අතර පශ්චාත් මරණ පරීක්ෂණයේදී අනාවරණය වී ඇත්තේ මොට ආයුධවලින් පහරදීම නිසා ඇතිවූ තැළීම් සහ සිරුර අභ්‍යන්තරයේ ඇතිවූ ලේ වහනය මත මරණය සිදුව තිබෙන බවය.

පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවත් සමග මෙය පහරදීමෙන් සිදුවූ ඝාතනයක් යැයි පිළිගත් අංගොඩ මානසික රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ධම්මිකා විජේසිංහ මේ බව ඥාතීන් වෙත දැනුම් දීමට පියවර ගෙන ඇත.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකළ මුල්ලේරියාව ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුනිමල් ශ්‍රියන්ත ඇතුළු නිලධාරීන් මෙම සිද්ධියට සම්බන්ධ සෞඛ්‍ය කාර්ය සහායකයන් සිව් දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබුණි. එම සැකකරුවන් අතරින් පහරදී ඝාතනය කිරීමට ඍජුවම සම්බන්ධ බව හඳුනාගත් දෙදෙනෙකු වැඩ තහනමට ලක්කිරීමටද රෝහල් අධ්‍යක්ෂවරිය පියවර ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සිව් දෙනා පෙරේද කොළඹ මහේස්ත්‍රාත් ප්‍රසන්න අල්විස් හමුවට ඉදිරිපත් කිරීමෙන් පසු ලබන 10 වැනිද තෙක් රක්ෂිත බන්ධනාගාර ගතකෙරුණි. මෙහිදී අධිකරණය හමුවේ කරුණු දක්වමින් විත්තියේ නීතිඥවරුන් අවධාරණය කර තිබුණේ මරණකරුගේ සිරුරේ තුවාල 35ක් දක්නට ලැබී ඇති බවය.

කෙසේ වෙතත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධනගේ ප්‍රධානත්වයෙන් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක්ද ආරම්භ කර තිබේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ සුදත් සමරවීරගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් එම රෝහලට ගොස් ප්‍රකාශ සටහන් කරගැනීමක්ද සිදුකරගෙන ඇති අතර ඔවුන් රෝහලේ ආරක්ෂිත කැමරා දර්ශනද නිරීක්ෂණය කිරීමට නියමිතය.

## හොරෙක් ඇල්ලුවාම....

එම නිසා මෙරට සම්පත් සොරකම් කරන ලද නිලධාරීන්ට කතා කළ යුත්තේ ඒ ඒ වචනයෙන් බවද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කළේය.

"පොස්පේට් එකට ගිහින් හොරෙක් ඇල්ලුවාම මාධ්‍ය හරහා සම්පූර්ණයෙන්ම ගහන්නේ මට. යූරියා බෑග් එක රුපියල් 90යි. ඒ මිනිහා රුපියල් 140ට අරගෙන. බුස් එක රුපියල් 3000යි හැබැයි 75000ට අරගෙන. මෝටරයක් ගෙනල්ලා මැෂින් එකට සවි කරන්න. ඒක ඇහුවාම කියනවා මම දන්නේ නැහැ ගෙනාවලු. සල්ලිත් බැඳලා චීනෙට. ඒවා ගිහින් අල්ලලා පෙන්නුවාම චාමර සම්පත් වැරදියි. චාමර සම්පත් කතා කරන්න දන්නේ නැහැ. දැන් එතකොට මම මොන භාෂාවෙන්ද කතා කරන්න ඕන හොරකම් කරන අයට. අපේ රටේ සම්පත් හොරකම් කරන අයට මම මොන භාෂාවෙන්ද කතා කරන්න ඕන? මම දැන් ඔතන හොඳට කතා කළා නම් ඒක මාධ්‍ය හරහා යන්නේ නැහැ. මම නරක වචනයෙන් කියපු නිසා තමයි මාධ්‍ය හරහා ගියේ. හොඳ දෙයක් කිව්වට මාධ්‍යයෙන් යන්නේ නැහැ" යැයිද රාජ්‍ය ඇමැතිවරයා පැවැසීය.

රාජ්‍ය ඇමැති චාමර සම්පත් දසනායක පසුගිය 17 වැනිද එප්පාවල පිහිටි ලංකා රාජ්‍යය පෝස්පේට් සමාගමේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අතර එහිදී විධායක නිලධාරියකු සමග ඇමැතිවරයා බහින්බස් වීමක් ඇති කර ගත්තේය.

## උපාසිකාවන් වගේ ඇවිත්....

පෙරේද (29 වැනිද) දින රුවන්වැලිසෑය අභියස පැවැති පිච්චමල් පූජාවට පැමිණි කාන්තාවන් දෙදෙනකුගේ ගෙල බැඳි රන්මාල, රුවන්වැලි සෑයේ ප්‍රධාන දෙරටුව අසල මල් ආසනයක් ළඟදි පැහැරගෙන ගොස් තිබේ. එදිනම තවත් වැඩිහිටි කාන්තාවකගේ ගෙල බැඳි රන් මාලයද එම ස්ථානයට ආසන්නයේදී පැහැරගෙන ගොස් ඇති අතර, ඔවුන් ඒ සම්බන්ධයෙන් අනුරාධපුර පොලිසියට පැමිණිලි කර ඇත. ඒ පිළිබඳව පොලිසිය කළ විමර්ශනයේදී මෙම කාන්තාවන් නවදෙනා සැකපිට අත්අඩංගුවට ගත් බව පොලිසිය පවසයි. මෙසේ අත්අඩංගුවට ගත් කාන්තාවන්, වෙන්නප්පුව, කොළඹ 10, වැල්ලම්පිටිය, ඔරුගොඩවත්ත, ඉරණමඩු ආදි ප්‍රදේශවල පදිංචිකාරියන් වන වයස අවුරුදු 16ත් 46ත් අතර පිරිසකි.

එදින පූජා භූමිය තුළ කඩාගත්තේ යැයි කියන රන්මාල තුනෙහි වටිනාකම ලක්ෂ අටක් පමණ වන බවට ගණන් බලා ඇතත් මෙතෙක් එම රන් භාණ්ඩ හමුවී නැත. අත්අඩංගුවට ගත් සැකකාරියන් සංවිධානාත්මකව රන් මාල කැඩීමේ ජාවාරමක නිරත වන්නේද යන්න විමර්ශන සිදුකරන බවද පොලිසිය සඳහන් කළේය.

## අධි ආරක්ෂිත කලාපයේ ....

මෙම පැමිණිල්ලට අනුව බස්නාහිර පළාත දකුණු දිසාව භාර අපරාධ කොට්ඨාසයෙන් ඇතුල්කෝට්ටේ පදිංචි දෙදෙනකු සමග රුපියල් විසිඅට ලක්ෂ දෙලොස්දහක් වටිනා යකඩ බට සොයාගෙන ඇත.

මෙම සැකකරුවන් රාත්‍රි කාලයේදී අධි ආරක්ෂිත කලාපයට රිංගා යකඩ බට ගලවා වගුරු බිම් දිගේ රැගෙන ගොස් වාහනවලට පටවා ඇතැයි හෙළි වී තිබේ.

මාසයක පමණ කාලයක් තිස්සේ රාත්‍රි කාලයේදී මෙම ආරක්ෂිත වැට ගලවාගෙන ගොස් ඇතැයිද හෙළි වී තිබේ.

අරගල සමයේ යුද හමුදාව මගින් පාර්ලිමේන්තු අධි ආරක්ෂිත කලාපයේ හා කථානායක නිල නිවසේ ආරක්ෂාවට එය ඉදිරිපස මෙම ආරක්ෂිත වැට ඉදිකර තිබිණි.

බස්නාහිර දකුණ දිසා අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සුමිත් ජයසිංහගේ උපදෙස් මත ඒකක ස්ථානාධිපති පොලිස් පරීක්ෂක හේමන්ත කුමාර, සැරයන් රංජිත් (38723) ඇතුළු කණ්ඩායමක් ඉතිරි යකඩ බට සොයා විමර්ශන අරඹා තිබේ.

# යකහළුල්පත කත මරා හැංගූ හැටි සැමියා වමාරයි



පොලිස් විමර්ශකයන් අපරාධ ගැන සෙවීමේදී අනුගමනය කරන ප්‍රධානම පිළිවෙත වන්නේ දන්නා දෙයින් නොදන්නා දෙය සොයා ගැනීමය. ඒ නියමය අපරාධයක් හඹා යාමට පාදක වන ප්‍රධානම තුරුම්පුවය. රිදීමාලියද්ද යනු මෙරට දුප්පත්ම අසංවර්ධිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන අතර ඒ ප්‍රදේශයට අයත් යකහළුල්පත ගම්මානය කිසිදු දුරකතන සම්බන්ධතාවක් නැති ප්‍රදේශයකි. මේ ප්‍රදේශයේ විසූ 50 හැවිරිදි කාන්තාවක් පසුගිය 2021 වසරේ පෙබරවාරි මාසයේ සිට ආගිය අතක් නොවූ අතර ලද තොරතුරු ඔස්සේ ඇයව ඝාතනය කිරීමේ සිද්ධිය මුළුමනින්ම අනාවරණය කර ගැනීමට රිදීමාලියද්ද පොලිසිය සමත් වූයේ දක්ෂ විමර්ශනයක ප්‍රතිඵලයක් ලෙසය.

රිදීමාලියද්ද පොලිස් ස්ථානාධිපති ආර්.සී වීරකෝන් වෙත මීට දෙසතියකට පෙර තොරතුරක් ලැබෙන්නේ යකහළුල්පත ප්‍රදේශයේ අතුරුදන් වූ කාන්තාවක් ගැනය. ඇය පනස් හැවිරිදි ඩබ්ලිව්.එම්. සෝමාවති නමැත්තියකි. මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ ස්ථානාධිපතිවරයා බදුල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුජිත් වෙදමුල්ලගේද උපදෙස් මත විමර්ශන ආරම්භ කරන්නේ පොලිස් විශේෂ කාර්යාංශයේ මෙන්ම ප්‍රජා පොලිස් නිලධාරින්ගේද සහාය ඇතිවය.

## මළ සිරුර පැදුරක ඔතා වැසිකිළිවලට දමන්න පුතාත් සහාය දීලා

මේ අනුව කළ සොයා බැලීමේදී මෙලෙස අතුරුදන්වූ කාන්තාව කුඩා කල පටන්ම මාපිය රැකවරණය අහිමි තැනැත්තියක් බවත් ඇය උස් මහත්කර ඇත්තේ මහියංගණය ප්‍රදේශයේ මරණ පරීක්ෂකවරයකු බවත් හෙළිව ඇත. මේ අනුව මීට වසර විසි හතකට පෙර ඇය රිදීමාලියද්ද යකහළුල්පොත ප්‍රදේශයේ තමාට වඩා අවුරුදු 22 කින් වැඩිමහල් අයෙකු සමග විවාහ වී ඇති අතර ඔවුන් දෙදෙනාට දුවක් සහ පුතෙකු ද ලැබී ඇත. දියණිය හසලක ප්‍රදේශයේ පුද්ගලයකු හා විවාහ වී තිබෙන බවත් පුතු සෝමාවතීගේ නිවසට මීටර් විස්සක පමණ ඈතින් වෙනම නිවසක් තනාගෙන බිරිඳ සහ දරුවා සමගින් ජීවත්ව සිටින බවත් මෙහිදී අනාවරණය වී ඇත.

සෝමාවතී කොළඹ, මහනුවර, කුරුණෑගල ප්‍රදේශවල විවිධ තැන්වල රැකියා කර තිබෙන බවත් ඇය නිවසට පැමිණෙන්නේ මාසයකට දෙකකට සැරයක් බවත් පොලිස් විමර්ශන වලින් හෙළිවී ඇති අතර ඇය බාහිර පුද්ගලයන් කිහිප දෙනකු සමගින් අනියම් සම්බන්ධතා පැවැත්වීම නිසා සැමියාගේ අඩන්තේට්ටම්වලට ලක්වූ තැනැත්තියක් බවත් හෙළිව ඇත.

කෙසේ වෙතත් අතුරුදන් මෙම කාන්තාවගේ සැමියා විසින් ගම්මානයේ විවිධ පුද්ගලයන් සමගින් පවසා ඇත්තේ තම බිරිඳ විවිධ ප්‍රදේශවල රැඳී සිට රැකියා කරන නිසා කොවිඩ් 19 වැලඳීමෙන් මිය ගොස් ඇති බවය.

කෙසේ නමුත් යකහළුල්පොත ගම්මානයේ ග්‍රාම නිලධාරිවරයා ද බදුල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත දන්වා යවා ඇත්තේ මෙම කාන්තාව මියගොස් ඇති බවටය. නමුත් ඇය මියගිය බව සනාථ කිරීමට හැකි කිසිදු වෛද්‍ය වාර්තාවක් හෝ මරණ පරීක්ෂණ වාර්තාවක් නොමැතිව ග්‍රාම නිලධාරිවරයා විසින් අදාළ දැනුම් දීම කර ඇති බවද හෙළිවී ඇත. එමෙන්ම විජේතුංග මුදියන්සේලාගේ සෝමාවතී නමැති 50 හැවිරිදි මෙම කාන්තාවගේ නමින් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කර ඇති ජාතික හැඳුනුම්පත් අංකය 1994 වසරේදී උපත ලද දියණියගේ ජාතික හැඳුනුම්පත් අංකයයි.

හෙළිවූ මෙම තොරතුරු මත පොලිසියේ සැකය වී තිබුණේ කාත් කවුරුත් නැති මෙම කාන්තාවගේ මරණය ඝාතනයක් හෝ වෙනයම් අපරාධයක් වන්නට ඇති බවය. මේ අනුව බදුල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුජිත් වෙදමුල්ලගේ උපදෙස් මත රිදීමාලියද්ද පොලිසයේ ස්ථානාධිපතිවරයා අදාළ කාන්තාව පදිංචි නිවසට ගොස් ඇයගේ සැමියාගෙන් ප්‍රශ්න කර තිබිණි. පොලිසියේ ප්‍රශ්න කිරීම්වලදී පැකිලෙමින් සහ භීතියකින් පිළිතුරු දුන් සැමියා ගැන පොලිසියේ සැකය තීව්‍ර වන්නට විය.

## සිරුර අද ගොඩ ගනී

ස්ථානාධිපතිවරයා විසින් මේ පුද්ගලයාට පසුගියද (28 වැනිද) උදෑසන පොලිසියට පැමිණෙන්නැයි දැනුම් දුන්නේ වැඩිදුර විමර්ශන සඳහාය.

එහිදී රිදීමාලියද්ද පොලිස් ස්ථානාධිපතිවරයා විසින්ම මෙම පුද්ගලයාගෙන් ප්‍රශ්න කර තිබුණු අතර පැය හයකට ආසන්න කාලයක් කරන ලද ප්‍රශ්න කිරීම්වලදී මෙය ඝාතනයක් බව අනාවරණය විය.

සෝමාවතී නමැති මෙම කාන්තාව පසුගිය 2021 වසරේ පෙබරවාරි මාසයේ දිනක තම නිවසට පැමිණ තිබේ. ඒ පෙබරවාරි 13 වැනිද හෝ ආසන්න දිනයක ය. මෙම කාන්තාව නිවසට පැමිණ දින දෙක තුනක් රැඳී සිට හසලක පිහිටි තම දියණියගේ නිවසටද ගොස් එහිද දින කිහිපයක් රැඳීසිට ඇත. ය හිතුමතේට විවිධ ප්‍රදේශවලට යන තැනැත්තියකි. ඇය යකහළුල්පොත නිවසට පැමිණ ආපසු නිවසින් කුරුණෑගලට යෑමට අවශ්‍ය බව කියා ඒ සඳහා ප්‍රමාණවත් මුදල් නොමැති නිසා සැමියාගෙන් රුපියල් පන්සියයක මුදලක් ඉල්ලා ඇති බවත් සැමියා ඇයට මුදල් ලබා දීම ප්‍රතික්ෂේප කළ නිසා දෙදෙනා අතර ආරවුලක් ඇතිව තිබෙන බවත් පොලිස් විමර්ශන මගින් හෙළිවී ඇත.

සෝමාවතීගේ කල්ක්‍රියාව නිසාම ඇයත් සැමියාත් අතර නිරන්තරයෙන් ආරවුල් ඇතිවන නමුත් 13 වැනිද රාත්‍රියේත් 14 වැනිද උදෑසනත් ඇතිවූ ආරාවුල වෙනදට වඩා දුර ගොස් ඇත. සෝමාවතී පදිංචි මෙම නිවසේ තිබූ බුරුත ගසක් සැමියා විසින් කපා අලෙවි කර විශාල ආදායමක් උපයාගෙන ඇති බව සඳහන් කරමින් ඇය මුදල් ඉල්ලා ඇති බවත් එයින් උරණ වූ සැමියා විසින් එල්ල කළ පොලු පහරකින් ඇය ජීවිතක්ෂයට පත්ව ඇති බවත් පොලිසිය සඳහන් කරයි.

බුදු පුතේ මාව බේරගන්න යනුවෙන් මෙම කාන්තාව කෑ ගසන ශබ්දය ඇසී 26 හැවිරිදි ඇයගේ පුතු නිවසට දිව විත් තිබේ. එහිදී නිවසින් පිටතට පැමිණි පියා උඹ උඹේ වැඩක් බලාගනින්... මේක මගේ ප්‍රශ්නයක් යැයි කියමින් පුතුට බැණ වැදී තිබේ.

මඳ වේලාවකට පසු පුතුගේ නිවසට ගිය පියා මව මියගිය බව පුතුට සඳහන් කිරීමෙන් පසු දෙදෙනාම එක්ව මවගේ මළ සිරුර රෙදි කැබැල්ලකින් ඔතා එය තවත් පැදුරකින් ඔතා ගැටගසා නිවසේ කපා දමා තිබූ වැසිකිළිවළකට දමා ඊට උඩින් අතුකැබලි කුණු රොඩු ආදියද දමා වළ වසා දමා තිබේ. මේ සියල්ල පාපොච්චාරණය කර තිබුණේ ඝාතනයට ලක්වූ කාන්තාවගේ සැමියා හා පුතුගෙන් කළ ප්‍රශ්න කිරීම්වලදීය.

මේ අනාවරණයත් සමග පිය පුතු දෙදෙනා අත්අඩංගුවට ගත් රිදීමාලියද්ද පොලිසිය ඝාතනයට ලක් වූ කාන්තාව වැළලූ ස්ථානයද පරීක්ෂාවට ලක් කළේය. සැකකරුවන් දෙදෙනා මහියංගණය වැඩ බලන මහෙස්ත්‍රාත් ජ්ස් .ගෝවින්ද ආගෝස්තු මස 9 වැනිද දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙසත් මළ සිරුර අද ( 31 ) වැනිද ගොඩ ගන්නා ලෙසත් නියෝග කළ මහෙස්ත්‍රාත්වරයා එදිනට සැකකරුවන් දෙදෙනාද රැගෙන එන ලෙසට නියෝග කළේය. මේ අනුව රිදීමාලියද්ද පොලිසිය මෙම ඝාතනය පිළිබඳ වැඩිදුර විමර්ශන සිදු කරයි.

■ එෆ්.අස්ලම්
■ විමුක්ති සංජය පෙරේරා - වියළුව



# කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk
කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk
Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

## අංගොඩ යැවීමට නෙලී බ්ලයි කෙනකු වුවමනා කර තිබේ

10 Days in a Mad House හෝ Escape from Mad House යන සිනමා නිර්මාණ නරඹා ඇති කෙනකුට විවිධාකාර මානසික ව්‍යාධිවලට ගොදුරු වූවන් රඳවාගෙන ප්‍රතිකාර කරන මානසික රෝහලක සැබෑ ස්වභාවය කුමක්දැයි යම් අදහසක් ඇතිකර ගත හැකිය. එවක ඇමරිකාවේ බෙහෙවින් බලපෑම් කළ Newyork World නමැති පුවත්පතෙහි ප්‍රධාන සංස්කාරකවරයා අලුතෙන් යමක් ලිවීම සඳහා කතාබහ කරගැනීමට තමන් හමුවට පැමිණි මාධ්‍යවේදිනියකට අපූරු යෝජනාවක් කළේය. මාධ්‍යවේදිනියගේ නම් අරමුණ වී තිබුණේ ඒ කාලය වනවිට නරා දුක්වින්ද කම්කරු කාන්තාවන් පිළිබඳ ලිපි මාලාවක් පුවත්පතට සම්පාදනය කිරීමය. එහෙත් ප්‍රධාන සංස්කාරකවරයා ඇයට යෝජනා කළේ උමතු රෝගයට ගොදුරු වූ කතුන් රඳවා සිටින උන්මත්තකාගාරයකට රෝගිනියක සේ ඇතුළු වී සති දෙකක පමණ කාලයක් එහි වාසය කර ඒ පිළිබඳ ලිපි මාලාවක් ලියන ලෙසයි. ප්‍රධාන සංස්කාරකවරයා සියලු වගකීම් භාර ගත්තේය. යම් නෛතික ගැටලුවක් උද්ගත වුවහොත් තම ආයතනයේ නීතිඥයන් ලවා ඇය වෙනුවෙන් පෙනී සිටින බවද ප්‍රධාන සංස්කාරකවරයා ඇයට පොරොන්දු විය. ඒ අනුව මාධ්‍යවේදිනිය පළමුව ගොස් නතර වූයේ කාන්තා නේවාසිකාගාරයකය. එහිදී ඇය උමතු රෝගිනියක් සේ රඟපෑවාය. ඒ පිළිබඳ බියට පත්වූ සෙසු කාන්තාවෝ ඇය පිළිබඳ පැමිණිලි කළහ. ඒ අනුව බලධාරීහු ඇය බ්ලැක් වෙල් නමැති උන්මත්තකාගාරයට පිටත් කර යැවූහ. ඇය එහි සති දෙකකට ආසන්න කාලයක් විසුවාය. ඇයට පොරොන්දු වූ පරිදිම ප්‍රධාන සංස්කාරකවරයා නීතිඥයකු යවා ඇය උන්මත්තකාගාරයෙන් නිදහස් කරගත්තාය. ඉන්පසුව ඇය 10 Days in a Mad House යන මැයෙන් ලිපි මාලාවක් පුවත්පතට සම්පාදනය කළාය. එම ලිපි මාලාව නිව්යෝර්ක් බලධාරින්ගේ ඇස් අරවන්නට විය. ඒ අනුව වහා ක්‍රියාත්මක වූ ඔවුහු සියලු උන්මත්තකාගාරවලට මුදල් යෙදවීමටත්, රෝගීන් පිළිබඳ හොඳින් සොයා බැලීමටත් පියවර ගත්හ. මානව හිමිකම් නොමැත්තවුන් සේ පැත්තකට දමා සිටි මෙකී මානසික රෝගීන් පිළිබඳ ඇස් ඇරුණේ මෙම ලිපි මාලාව නිසාය. උන්මත්තකාගාරයට ගොස් උමතු රෝගිනියක් සේ ජීවත් වී මෙකී ලිපි මාලාව සම්පාදනය කළේ නෙලී බ්ලයි (Nelly Bly) යන අන්වර්ත නාමයෙන් පෙනී සිටි එළිසබෙත් ජේන් ක්‍රොක් නමැති මාධ්‍යවේදිනියයි. ගවේෂණාත්මක මාධ්‍ය ක්ෂේත්‍රයේ විශිෂ්ටතම මාධ්‍යවේදිනියක සේ තවම ඇය ගැන හඳුනා ලබයි. මෙම මාධ්‍යවේදිනිය තම ලිපි මාලාව මගින් උන්මත්තකාගාර සේවකයන් රෝගීන්ට කරන නොයෙක් කායික මානසික පීඩාවන්ද, ඔවුන්ට කෑමට දෙන පුස් කෑ පාන්, නරක් වූ මස් මාළු ආදිය ගැනද එසේම රෝගීන්ට නිදා ගැනීමට සිදුවන මීයන් පොකුරු පිටින් ගැවසෙන කාමර ගැනද ඇමරිකානු සමාජය දැනුම්වත් කළාය.

හදිසියේ නෙලී බ්ලයි අපට මතක් වූයේ කවර හේතුවක් නිසාදැයි ගැටලුවක් ඇතිවිය හැකිය. සැබැවින්ම අපට ඇය සිහිපත් වූයේ සහේතුකවමය. එයට ආසන්නම හේතුව මේ මස 20 වැනිද අංගොඩ මානසික සෞඛ්‍ය විද්‍යායතනයට යම් මානසික ව්‍යාධි තත්ත්වයක් හේතුවෙන් ඇතුළු කරන ලද හතළිස්පස් හැවිරිදි පුද්ගලයකු විසිපස්වැනිද රෝහල් සේවකයන් කිහිප දෙනකු විසින් පහර දී ඝාතනය කිරීමේ සිදුවීමයි. තොරතුරු වන පරිදි ඝාතනයට ලක්වූ පුද්ගලයා දිය නාමින් සිටියදී මෙකී රෝහල් සේවකයන්ට වතුර ගසා තිබේ. ඉන් කෝපයට පත්වූ රෝහල් සේවකයෝ කොසු මිටක් දෙකට කැඩෙන තරමට අසරණ රෝගියාට පහර දුන්හ. එහෙත් රෝහල් බලධාරීන් උත්සාහ කළේ මෙකී පුද්ගලයා නාන කාමරයේ ඇද වැටී ඇතිවූ තුවාල හේතුවෙන් මියගොස් තිබෙන බව ඒත්තු ගැන්වීමටය. එහෙත් එය සම්පූර්ණ අසත්‍යයක් බව වෛද්‍ය වාර්තාවෙන් හෙළිවී තිබේ. ඒ අනුව මියගිය පුද්ගලයාගේ ශරීරයේ අභ්‍යන්තර රුධිර වහනයක්ද සිදුව තිබෙන අතර පහර දීම් හේතුවෙන් තැළීම් කිහිපයක්ද නිරීක්ෂණය වූ බව වාර්තාවෙහි දැක්වේ. පහර කෑමට ලක්වූ රෝගියාගේ ජීවිතය බේරාගැනීමට හැකියාව තිබියදී ඔහු රෝහල් ගත නොකර ඔහුට මියැදීමට සලස්වා ඇත්තේ මෙම සිදුවීම වසන් කිරීමට බව පැහැදිලිය. එහෙයින් අපට පෙනෙන පරිදි මෙම ම්ලේච්ඡ ඝාතනය සම්බන්ධයෙන් සුළු සේවකයන් පමණක් නොව ඊට වගකිවයුතු සියලු දෙනා අත්අඩංගුවට ගත යුතුය. ඔවුන්ගේ වැඩ තහනම් කළ යුතුය. පහර කෑ රෝගියා රෝහලකට ඇතුළු නොකර ඔහුට මියයන්නට ඉඩ දීම කෙතරම් නම් ම්ලේච්ඡත්වයක්ද? එමගින් ඉස්මතු වන අමනුෂ්‍යත්වය කෙතරම් නම් බිහිසුණුද? රෝගීහු නම් අසරණයෝය. ඒ අතරින් මානසිකව රෝගී වූවෝ බෙහෙවින් අසරණ වෙති. එවැනි අසරණ රෝගියකුට අංගොඩ මානසික සෞඛ්‍ය විද්‍යායතනය සැලකූ ආකාරය සිහිවන විට අපට රටවැසියන් හැටියට ඇතිවනුයේ ඉමහත් ලජ්ජාවකි. ඉමහත් වේදනාවකි. අසරණ වූ මානසික රෝගීන්ට සලකන්නේ මෙහෙම නම් අප රටේ ශිෂ්ටත්වය, සභ්‍යත්වය, සදාචාරය පිළිබඳ කවර කතාද? ගෙඩි පිටින් නිවන් දකින්න බණ කියන හාමුදුරුවරු මේවා පිළිබඳ ප්‍රකාශ කරන්නේ කුමක්දැයි දැනගත යුතුය. සමහරුන් නම් සඳහන් කරන්නේ මෙය බුදුන් වැඩිය නොව උපන් භූමිය බවය. එහෙත් මෙවැනි ම්ලේච්ඡ සිදුවීම්වලින් මේ රට වැටී තිබෙන තැන හොඳටම පැහැදිලිය. ඝාතනය වූ පුද්ගලයාගේ පාර්ශ්වය වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටි නීතිඥයකු ප්‍රකාශ කළේ මියගිය තැනැත්තාගේ ශරීරයේ තුවාල තිස්පහක් නිරීක්ෂණය වූ බවය. එමගින් රෝගියා පාලනය කිරීමට නොව ඔහු මරා දැමීමටම පහර දී ඇති බව පැහැදිලිය. අනෙක් අතට රෝගියකු නොව කිසිවකු හෝ පාලනය කිරීම සඳහා පහරදීමට රජයේ ආයතනවලට කිසිදු නෛතික අවසරයක් නොමැත. කෙසේ වුවද මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට ආණ්ඩුව නිසි පියවර නොපමාව ගත යුතුය. මානසික වශයෙන් රෝගී වූවෝද අප වැනි මනුෂ්‍යයෝය. ඔවුනටද මානව හිමිකම් තිබේ. මේ රටේ තිබෙන මානසික සෞඛ්‍ය ආඥා පනත 1870 සම්මත කරගත් එකකි. එය 1874 යම් සංශෝධනයකට ලක්කර තිබේ. එහෙත් මෙම ආඥාපනත අදට වලංගු නැත. එමගින් මානසික වශයෙන් රෝගී වූවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අවධානය යොමුකර නොමැත. සමහර මැති ඇමැතිවරුන් ආදීන්ට තමන්ට අවනත නොවන පුද්ගලයන් මානසික රෝගීන් යැයි නම් කර අංගොඩට පැටවීමට හැකිවී තිබෙන්නේ මෙම යල් පැනපු ආඥාපනත නිසාය. එනිසා සකල නීති වෙනස් කරන අධිකරණ ඇමැතිවරයාගේ අවධානය මේ වෙනුවෙන්ද යොමුවිය යුතු බව අවධාරණය කළ යුතුය.



# 13 ගැන තමන්ගේ මතය සෑම දේශපාලන පක්ෂයක්ම කිව යුතුයි

**දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව වන කතා බහ මේ දිනවල දේශපාලන වේදිකාවල උණුසුම් පුවත් මවන ජනප්‍රිය මෙන්ම විවාදාත්මක මාතෘකාවකි. එයට පක්ෂව මෙන්ම විපක්ෂවද විවිධ පාර්ශ්ව අදහස් දක්වති.මේ සම්බන්ධව කැලණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අංශයේ මහාචාර්ය ඔසන්ත එන්. තල්පාවිල සමග "අරුණ" කළ සාකච්ඡාවයි මේ.**

**දහතුන්වැනි සංශෝධනය තමයි මේ දවස්වල අපේ දේශපාලන ක්ෂේත්‍රය උණුසුම් කරන මාතෘකාව. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා හිටි හැටියේම ආයෙත් දහතුන ගැන කතා කිරීමත් ඇතැම් දේශපාලනඥයන් ප්‍රශ්න කරනවා. දේශපාලන විද්‍යාව පිළිබද ප්‍රාමාණිකයෙක් විදිහට මේ වෙලාවේ 13 ගැන තියෙන කතාබහ පිළිබඳව ඔබ මොනවද හිතන්නේ...?**

මට හිතෙන විදියට දහතුන්වැනි සංශෝධනය පිළිබඳව කතාබහ නැවත ඇතිවෙන්න බලපාන ප්‍රධාන හේතු දෙකක් තියෙනවා.

පළමුවැන්න, ලංකාවේ වාර්ගික අර්බුදය කියලා කියන්නේ වර්තමානයේ වගේම මීට පෙර රාජ්‍ය බලය ලැබුණ අවස්ථාවලත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉතාමත්ම සංවේදී වූ මාතෘකාවක්. වාර්ගික අර්බුදය සම්බන්ධයෙන් යම්කිසි එකඟතාවයකට පැමිණිය යුතුයි කියලා ඔහු අවස්ථා ගණනාවකදීම අවධාරණය කරලා තියෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් 2001 දී එල්ටීටීඊ සංවිධානය සමග එළැඹුණ ගිවිසුම තුළිනුත් යුද්ධය වෙනුවට වෙනත් දේශපාලන විසඳුමකට එළැඹීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කර ගැනීමට තමයි ඔහු බලාපොරොත්තු වුණේ. එවකට තිබුණු සටන්කාමී සංවිධාන සහ වෙනත් දේශපාලන පක්ෂ සමග සාකච්ඡා මාර්ගයෙන් දේශපාලනමය විසඳුමකට ළඟාවීමට ඔහු උත්සාහ කළා. රනිල් වික්‍රමසිංහ කියන්නේ ලංකාවේ වාර්ගික ගැටලුව සම්බන්ධයෙන් යම් දේශපාලනික විසඳුමකට එළැඹිය යුතුයි කියන ස්ථාවරයේ හිටිය නායකයෙක් කියලා ඉතිහාසය දිහා බලද්දී අවබෝධ වෙනවා.

රටේ විශාල විරෝධයක් පවතින අවස්ථාවක පවා ඔහු එල්ටීටීඊ සංවිධානය සමග ගිවිසුමකට එළැඹුණා. නමුත් එවකට සිටි ජනාධිපතිවරිය රජය විසුරුවා හැරීම නිසා ඒ ගිවිසුම අක්‍රිය වුණා. කෙසේ වෙතත් ජනවාර්ගික අර්බුදයට සාකච්ඡා මාර්ගයෙන් දේශපාලන විසඳුමක් ලබාදීමට රනිල්ට අවශ්‍ය වෙලා තිබුණා කියලා පසුකාලීනව දේශපාලන වේදිකාවල ඔහු කළ ප්‍රකාශ තුළිනුත් පැහැදිලිව අවබෝධ වෙනවා. මෙවර ඔහු ජනාධිපති බවට පත් වුණාට පසුව නැවතත් ඒ ස්ථාවරයටම එළඹිලා ඉන්නවා කියලා මම හිතනවා.

දෙවැනි කාරණාව, මේ ප්‍රශ්නය හා සම්බන්ධ සංවේදී බාහිර පාර්ශ්වයන් ඉන්නවා. උදාහරණයකට ඉන්දියාව පෙන්වා දෙන්න පුළුවන්. ඒ වගේම වෙනත් ද්‍රවිඩ පක්ෂවලට හා කණ්ඩායම්වලට හිතවාදී කණ්ඩායම් ඉන්නවා. රනිල් වික්‍රමසිංහ කියන්නේ ජනවාර්ගික අර්බුදය සම්බන්ධයෙන් සංවේදී නායකයෙක් කියලා දැනගත්ත මේ පිරිස් සහ කණ්ඩායම් මේ ගැටලුව විසඳන්න දේශපාලන තීන්දු තීරණ ගන්න ජනාධිපතිවරයාව පෙළඹවීමක් කළා වෙන්නත් පුළුවන්.

විශේෂයෙන්ම මෙහි දී ඉන්දියාව ගැන කතා කළොත් පහුගිය ආර්ථික අර්බුදය හමුවේ ඉන්දියාව වෙන කිසිම රටකින් නොදුන් ආකාරයේ සහයෝගයක් ලංකාවට ලබා දුන්නා. ඉන්දියාවෙන් ලැබුණු සහයෝගය ගැන කුමන විවේචන ඉදිරිපත් වුණත් අපේ රට මුහුණ දුන් දරුණු අර්බුදවලින් යන්තම් හරි ගොඩ ගියේ ඉන්දියාවෙන් ලැබුණු සහයෝගය නිසා කියලා මම හිතනවා. කුමන රටවල් කුමන කණ්ඩායම් ඉන්දියාවට චෝදනා කළත් ඉන්දියාව අපට ඒ අවස්ථාවේදී ආර්ථිකමය සහයෝගයක් ලබා දුන්නා. ඒ දිනවල ලංකාවට පැමිණි ඉන්දීය නායකයන් රටේ වාර්ගික අර්බුදය සහ දහතුන්වැනි සංශෝධනය ගැන වරින් වර මතක් කළා. මේ වාර්ගික අර්බුදයට ශ්‍රී ලංකා රජය පිළිතුරක් ලබා දිය යුතුයි ඉන්දීය අගමැතිවරයා පවා කිව්වා.

මේ කාරණා දිහා බලද්දී ලංකාවේ වාර්ගික අර්බුදය විසඳන්න ජනාධිපතිවරයා තුළ තියෙන ස්වකීය අභිලාසය නිසා වගේම බාහිර පාර්ශ්වයන් විසින් වරින්වර ජනාධිපතිවරයාට කරන යම් යම් අනුබල දීම් සහ ඔහු උනන්දු කරවන සිදුවීම් නිසා දහතුන් වන ව්‍යවස්ථාව සම්බන්ධයෙන් සාකච්ඡාවක් මේ ආකාරයෙන් නැවතත් කරළියට පැමිණුනා කියලා මම හිතනවා.

**රනිල් වික්‍රමසිංහ දහතුන්වැනි සංශෝධනය ගැන මේ කතාකරන්නේ උතුරේ දෙමළ 'ඡන්ද කුට්ටිය' කඩා ගැනීමේ චේතනාවෙන් කියන චෝදනාව ගැන මොකද කියන්නේ?**

මේ ආකල්පය ඉතිහාසය පුරාම තිබුණ වැරදි ආකල්පයක්. කාටහරි කියන්න පුළුවන් 2009දී මහින්ද රාජපක්ෂ යුද්ධය දිනුවේත් දේශපාලන වාසි ලබාගැනීමේ වුවමනාවෙන් කියලා. එවැනි ප්‍රකාශවල සාධාරණත්වයක් හෝ ප්‍රායෝගිකත්වයක් නැහැ. ප්‍රතික්ෂේප කිරීම හෝ අගය කිරීම කියන කාරණාව දේශපාලන ක්‍රියාවලිය තුළ නිරන්තරයෙන් සිදුවන දෙයක් නිසා දහතුන්වන සම්බන්ධයෙන් පක්ෂව හෝ විපක්ෂව මතවාද ඉදිරිපත් වීම ගැන පුදුම වෙන්න දෙයක් නැහැ.

**ඔබ කියන්නේ මේ වෙලාවේ දහතුන ක්‍රියාත්මක කිරීම සහ ඒ මගින් යෝජිත ඉඩම් හා පොලිස් බලතල දීමේ අවශ්‍යතාවයක් තියෙනවා කියලද?**

මම කියන්නේ 13ක අවශ්‍යතාවයක් තියෙනවා කියලා නෙමෙයි. නමුත් විටින් විට මතු වෙමින් යටයමින් පවතින ජනවාර්ගික ගැටලුවට කුමන හෝ ආකාරයක විසඳුමක් ලබා දිය යුතුව තියෙනවා. උතුරේ සහ දකුණේ ජනතාව අතර මේ දිනවල අර්බුදයක් නැහැ. ඒ නිසා මේ දවස්වල ඇයි ජනවාර්ගික අර්බුදය ගැන කතා කරන්නේ කියලා කෙනෙක්ට ප්‍රශ්න කරන්න පුළුවන්. නැති ප්‍රශ්නයක් ඇති කරනවා කියලා චෝදනා කරන්නත් පුළුවන්. නමුත් මේ ජනවාර්ගික අර්බුදය තවත් ටික කාලයකින් වෙනස්ම මුහුණුවරකින් ඉස්මතු වෙන්නත් පුළුවන්. ඒ තුළින් විශාල විනාශයක් වෙනවා. ලංකා ඉතිහාසය ජනවාර්ගික අර්බුදයේ ප්‍රතිවිපාක වලට ඕනෑවටත් වැඩියෙන් උදාහරණ සපයනවා. අපි අවුරුදු තිහක විශාල යුද්ධයකට මුහුණ දුන්නා. යුද්ධයේ බිහිසුණු අත්දැකීම් අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. අවුරුදු තිහක යුද්ධයක් නොතිබුණා නම් සමහර විට අපි මේ වනවිටත් ආර්ථික අතින් ශක්තිමත් රටක් කියලා ඇතැම් ආර්ථික විද්‍යාඥයන් කියනවා. ජනවාර්ගික අර්බුදය කියලා කියන්නේ රට තුළ පවතින වරින් වර ඉස්මතු වන ප්‍රශ්නයක්. යුද්ධයක් නොතිබුණත් ප්‍රචණ්ඩකාරී සිදුවීම් නොවුනත්, ද්‍රවිඩ දේශපාලනඥයන් යම් යම් ආකාරයේ බලාපොරොත්තු තියාගෙන ඉන්නේ. ඔවුන් තවමත් ඉන්නේ බලය පිළිබඳව සෑහීමකින් නෙමෙයි. නිදහසින් පසුවත් බලය පිළිබඳව ඔවුන්ගේ බලාපොරොත්තු අඩුවෙලා හෝ සැඟවිලා නැහැ. ඒ නිසා ජනවාර්ගික අර්බුදයට විසඳුමක් ලබාදීම අනිවාර්යයි.

**ඔබට දැනෙන විදිහට දහතුන සම්බන්ධයෙන් උතුරේ දේශපාලනඥයන්ට තියෙන්නේ මොන වගේ අරමුණක් ද?**

උපරිම බලතල ලබා ගැනීමට උතුරේ දේශපාලනඥයන්ට අවශ්‍යය වෙලා තියෙනවා. ඒ ගැන විවාදයක් නෑ. දහතුන්වන සංශෝධනය තුළ බලය කියන කාරණාව සීමා කර ගැනීමට ඔවුන් උත්සාහ කරනවා වගේම ඒ සඳහා ඉන්දියාවෙන් ඔවුන්ව පොළඹවනවා. දහතුන තිබුණත් පොලිස් සහ ඉඩම් බලතල ආදිය ලැබිලා නැහැ. ඒ නිසා දහතුන්වන සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කර ගැනීමේ අභිලාසයක් උතුරේ දේශපාලනඥයන් තුළ තියෙනවා කියලා මම හිතනවා. කොහොම වුණත් උතුරේ දේශපාලනඥයන් සියල්ල අමතක කරලා ඉන්නවා කියලා කියන්න බැහැ.

**දකුණේ ජනතාව අකමැති දෙයක් උතුරට එපා කියලා ආර්. සම්බන්ධන් මන්ත්‍රිවරයා පහුගිය දවසක පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා නේද?**

දකුණේ සහ උතුරේ ජනතාව අතර මතය පෙන්වන්න පුළුවන් එකම තැන තමයි පාර්ලිමේන්තුව. මොන පනතක් මොන යෝජනාවක් ආවත් එය පාර්ලිමේන්තුවෙන් සම්මත විය යුතුයි. එහෙම නැත්නම් ජනමත විචාරණයකට යා යුතුයි. පාර්ලිමේන්තුව තුළ බලවත් දකුණේ ජන මතය කියලා හිතමු. එතකොට මූලිකත්වය දෙන්නේ බලවත් මතයට.කොහොම වුණත් ආර්. සම්බන්ධන් මන්ත්‍රිවරයා අදහස් කළේ සියලු දෙනාගේම කැමැත්ත පරිදි ඉදිරිපත් වන යෝජනාවකට ඔවුන් කැමැතියි කියන කාරණාව වෙන්නත් පුළුවන්. කොහොම වුණත් මේ තුළින් උතුර සහ දකුණ අතර තිබෙන මතවාදය කිරා බැලීමක් වෙනවා.

**පිරිසක් දහතුන්වැනි සංශෝධනයට පක්ෂව කතා කරනවා. තවත් පිරිසක් එයට විපක්ෂව අදහස් ඉදිරිපත් කරනවා. මේ අතර දහතුන සම්බන්ධයෙන් ජවිපෙ වගේ පක්ෂ තවමත් නිහඬ පිළිවෙතක් අනුගමනය කරන බවක් පේනවා. එයත් යම් දේශපාලනික උපක්‍රමයක් විදිහට ඇතැමුන් අර්ථ ගන්වනවා...**

තම තමන්ගේ පුද්ගලික දේශපාලන න්‍යාය පත්‍රයන්ට අනුව ඔවුන් අදහස් ප්‍රකාශ කරනවා හෝ නිහඬව ඉන්නවා වෙන්න පුළුවන්. නිහඬව සියල්ලම අධ්‍යනය කරලා නිගමනයකට එළඹෙනවා කියලා නිහඬව ඉන්න පිරිස හිතනවා වෙන්නත් පුළුවන්. නමුත් ජාතික දේශපාලන පක්ෂයක් හැටියට කුමන හෝ කණ්ඩායමක් පෙනී සිටිනවා නම් ඒ අය මෙවැනි කාරණාවන් සම්බන්ධයෙන් සංවේදී විය යුතුයි කියලා මම හිතනවා. අඩුම තරමින් ඔවුන්ගේ මතය හෝ ඉදිරිපත් කළ යුතුයි. ඒ මතය හුදු දේශපාලන මතයක් නොවී රට වෙනුවෙන් වැදගත්, ඉදිරියේදී තීන්දු තීරණ ගැනීම සඳහාවත් යොදගත හැකි මතයක් විය යුතුයි.

**ලංකාව සහ ඉන්දියාව යා කරමින් ගොඩනැගෙනවා යැයි කියන පාලම සම්බන්ධයෙනුත් මේ දවස්වල විවිධ කතා ඇහෙනවා? රනිල් වික්‍රමසිංහ මේ හැම තීරණයක්ම ගන්නේ ඉන්දියාවේ වුවමනාවට මිස රට ගැන හිතලා නෙමෙයි කියලා තමයි බොහෝ දෙනෙක් කියන්නේ.?**

මෙවැනි කාරණාවන් අපේ රටේ දේශපාලනයට අලුත් මාතෘකා වුණාට ලෝකයේ අනෙක් රටවල් මෙවැනි සම්බන්ධතා ගොඩනගාගෙන බොහෝ කාලයක් ගත වෙලා.යුරෝපා ප්‍රජාව රටවල් අතර විවිධ සබඳතා ගොඩ නගාගෙන තියෙනවා. ඒ රටවල් වලට පොදු වීසා ක්‍රමයක් පවා තියෙනවා. ඒ රටවල් සංවර්ධනය කිරීම තමයි ඔවුන්ගේ බලාපොරොත්තුව. තමන්ගේ නිෂ්පාදන අලෙවි කරවා ගැනීම, ආනයන අපනයන පහසු කරවා ගැනීම සඳහා ඔවුන් රට රටවල් සමග එකඟතාවලට එළඹෙනවා. ඉන්දියාව සහ ලංකාව අතර ගොඩබිම් මාර්ගයක් ගොඩ නැඟීමෙහි වැරැද්දක් නැහැ. එය අපේ රටේ සංවර්ධනයට හේතුවක් වෙනවා. ලෝකයේ රටවල් අද නැඟී සිටින්නේ තනිවම නෙමෙයි. ලංකාවත් ඒ තත්ත්වයන්ට එකඟ විය යුතුයි. එමගින් ආර්ථික සමෘද්ධිය ළඟා කර ගැනීමට හැකියාව තියෙනවා. අද චීනය දියුණු වෙලා තියෙන්නේ නිකම්ම නෙමෙයි. ඔවුන්ගේ ආර්ථික මතවාදයට විරුද්ධ රටවල් සමග පවා ඔවුන් එකඟතාවලට එළැඹිලා තියෙනවා. ඒ නිසා සම්ප්‍රදායික මතවාද වලම එල්ලිලා ඉන්නේ නැතිව රටේ දියුණුව වෙනුවෙන් ගන්නා මෙවැනි තීරණවලට පාට පක්ෂ බේදයක් නැතුව සියලු දෙනා සහයෝගය ලබාදිය යුතුයි කියලා මම හිතනවා.

■ සංවාදය - නිරෝෂා වාසල






## ගපිරිගේ කවිය

### මාධ්‍යවේදියා ඇල්ලීම...

කිවුව ම 'ජර්නලිස්ට්' කියලත් ඇරෙස්ට් කළා
උඩුවරගෙදර හට හිරිහැර සැරට කළා
මේ මර්දනය දැ යි කවුදෝ ප්‍රශ්න කළා
අනුරපුරේ පිහි ඇනුමත් මතක් කළා

එළියක් දැල්වෙමිනි කවුරුත් නොසිතු විරූ
රතු එළියක් ය ඉතිහාසය මතක් කෙරූ
බේරන්නට ඇහැකි නම් ලොව ලොකුම හොරූ
මොන තර්ජන ද ඇහුණා කටහඬින් හුරූ

# පැය 24කදී නව දෙනෙක් මගමරුවාට බිලි

■ එෆ්. අස්ලම්
■ නිමල් ජයරත්න - මනම්පිටිය
■ කමල් සුරවීර - මහනුවර
■ ඒ.ඒ .ප්‍රේමසිරි - තිස්සමහාරාම

ප්‍රදේශ හතක පෙරේද (29 වැනිදා) සිදුවූ රිය අනතුරුවලින් පුද්ගලයන් නව දෙනකු ජීවිතක්ෂයට පත්ව ඇතැයි පොලිසිය පවසයි.

උඩුදුම්බර, දිඹුලපතන, කිරිඇල්ල, වාලච්චේන, තිස්සමහාරාම, කළුතර සහ කොටහේන ප්‍රදේශවලදී මෙම අනතුරු සිදුව තිබේ.

හුන්නස්ගිරියේ සිට මීමුරේ දක්වා රුසියානු ජාතිකයකු ඇතුළු පිරිසක් ගමන් කරමින් සිටි මෝටර් රථයක් ප්‍රපාතයකට පෙරළීමෙන් සිදු වූ අනතුරකින් රුසියානු ජාතිකයකු හා ලාංකික කාන්තාවක මියගොස් තිබේ. පෙරේද (29 වැනිදා) පස්වරු 12.30ට පමණ මෙම අනතුර සිදුව ඇතැයි උඩුදුම්බර පොලිසිය පැවසීය.

අනතුර සිදුවන අවස්ථාවේ මෝටර් රථයේ සිව්දෙනකු ගමන් කර ඇති අතර, ඉන් දෙදෙනකු තුවාල ලබා මහනුවර ජාතික රෝහල වෙත ඇතුළත් කර තිබේ. මෙලෙස තුවාල ලබා ඇත්තේ මෝටර් රථය පැදවූ එහි හිමිකරු සහ මියගිය ශ්‍රී ලාංකික කාන්තාවගේ සැමියා බව පොලිසිය සඳහන් කළේය.

වාලච්චේන ඕමානියා මඩු දෙසට ඇති අතුරු මාර්ගයක දූවිලි පාලනයට ජලය ඉසිමින් තිබූ බවුසරයක් පිටුපසට ධාවනය කිරීමේදී පිටුපසින් පැමිණි පාපැදියක ගැටී සිදුවූ අනතුරකින් සය හැවිරිදි දරුවකු ජීවිතක්ෂයට පත්ව තිබේ.

මියගිය දරුවා සමග පාපැදියේ ගමන් කළ මියගිය දරුවාගේ සොහොයුරු ද තුවාල ලබා වාලච්චේන රෝහල වෙත ඇතුළත් කර ඇත. මෙලෙස මියගොස් ඇත්තේ පූනානි රිදීතැන්න මුස්ලිම් ගම්මානයේ පදිංචිව සිටි එස්.එම්. රුස්කින් නමැති දරුවෙකි.

අදාළ බවුසරය ඉදිකිරීම් ආයතනයකට අයත් රථයක් වන අතර, ප්‍රකෝපකාරී වූ ගම්වාසීන් එහි රියදුරුට හා සහායකට පහරදී බවුසරයටද ගිනි තබා ඇත. පසුව ඔවුන් ඉදිකිරීම් ව්‍යාපෘති ආයතනයේ කාර්යාලයට පැමිණ එහි තිබූ කැබ් රථයකට හා තවත් වාහනයකට ද පහරදී අලාභ හානි සිදුකර තිබේ.

මෙම අනතුර සම්බන්ධයෙන් බවුසරයේ රියදුරු හා සහායක වාලච්චේන පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර, වාහනවලට ගිනිතබා පහරදුන් පුද්ගලයින් සොයා විමර්ශන ක්‍රියාත්මක ය.

ස්කෑන් කරන්න


වාලච්චේනයේදී ගිනි තැබූ බවුසරය



තිස්සමහාරාමයේදී අනතුරට පත් යතුරුපැදිය

තිස්සමහාරාම - කතරගම මාර්ගයේ ජූල්පල්ලම, 07 කණුව ප්‍රදේශයේදී වෑන් රථයක් තවත් රථයකට ඉස්සර කිරීමට යාමේදී යතුරුපැදියක ගැටී සිදුවූ අනතුරකින් යතුරුපැදියේ ගමන් ගත් අඹුසැමි යුවළක් මියගොස් ඇත.

මෙසේ මියගොස් ඇත තිස්සමහරාම ජූල්පල්ලම ප්‍රදේශයේ පදිංචි දෙදරු මාපිය යුවලක් වූ කේ. ජී. විමලාවති හෙවත් විමලාවති ගමගේ (51) සහ ඇගේ සැමියා වූ ආනන්ද අමරනාත් (61) නමති දෙදෙනෙකි. මියගිය කාන්තාව තිස්සමහාරාම ප්‍රදේශයේ පාසලක ගුරුවරියකි. අනතුර සිදුකළ වෑන් රථයේ රියදුරු තිස්සමහාරාම පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. රියදුරු බීමත්ව වෑන් රථය පදවා ඇතැයිද වැඩිදුර විමර්ශන වලදී හෙළි වී ඇත.

පානදුර - රත්නපුර මාර්ගයේ කිරිඇල්ල ප්‍රදේශයේදී ධාවනය වූ ඩිෆෙන්ඩර් රථයක් මෝටර් රථයක හා යතුරුපැදියක ගැටී සිදුවූ අනතුරකින් යතුරුපැදිකරු ජීවිතක්ෂයට පත්ව ඇත. මෙලෙස මියගොස් ඇත්තේ කිරිඇල්ල, කොඩිතුවක්කුකන්ද ප්‍රදේශයේ පදිංචිව සිටි ආසිරි බණ්ඩාර නමති පුද්ගලයෙකි. ඔහු ස්වාධීන රූපවාහිනියේ සේවකයෙකි.

දිඹුලපතන - මවුන්වර්නන් කන්ද අතුරුමාර්ගයේදී ට්‍රැක්ටරයක් පෙරළී යාමෙන් එහි රියදුරු ජීවිතක්ෂයට පත්ව තිබේ. මෙලෙස මියගොස් ඇත්තේ වටගොඩ, උතුරුමැද කුඹුර, හෙනිසි කොටසේ පදිංචි 48 හැවිරිදි පුද්ගලයෙකි.

කටුකුරුන්ද නගරයේ දී ත්‍රිරෝද රථයක් පදිකයකුගේ ගැටී සිදුවූ අනතුරකින් පදිකයා මියගොස් ඇත. මෙලෙස මියගොස් ඇත්තේ කළුතර නාගොඩ පාරේ පදිංචිව සිටි විශ්‍රාමික දුම්රිය සේවකයකු බව කළුතර දකුණ පොලිසිය පැවසී. ත්‍රිරෝද රථයේ හිමිකරු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

කොටහේන, ආමර් වීදිය මංසන්දියේදී ශ්‍රී ලංගම බසයක් මාර්ගය හරහා ගමන් ගත් පදිකයකුගේ ගැටී සිදුවූ අනතුරකින් පදිකයා ජීවිතක්ෂයට පත්ව තිබේ. මෙලෙස මියගොස් ඇත්තේ කොළඹ, මහවත්ත පාරේ පදිංචිව සිටි 54 හැවිරිදි පුද්ගලයෙකි.

## ග්‍රහචාරය

2023 ජූලි මස 31 වැනිදා සඳුදා

රාහු කාලය
උදේ 7.37 සිට උදේ 9.11 දක්වා
රාත්‍රී 7.56 සිට රාත්‍රී 9.24 දක්වා

ශුභ දිශාව - නැගෙනහිර
මරු - වයඹ

### මේෂ
**කාරුණික සිතිවිලි**

බොහෝ දුරට යහපත් දවසක් වනු ඇත. තම දැනුම, කඩිසර බව හා කාරුණික සිතිවිලි එහි විශේෂ කොට සැලකේ. නායකත්වය ගෙන වැඩ කිරීමේ හැකියාව ඇති වේ. අවශ්‍යතාවන්ට එතරම් ගිජුකමක් නොදක්වන සේය.

### වෘෂභ
**යෝජනාවන්ට බාධා**

තම හැඟීම් මෙන්ම රුචි අරුචිකම් ද පැටළිලි ස්වභාවයෙන් යුතු වේ. විවෘත ජලාශවල තරගකාරී අභියෝගයන්ට නොඑළැඹෙන්න. විවාහ යෝජනාවන්ට බොහෝදුරට බාධක සහිතය.

### මිථුන
**උසස් අයගේ ඇසුරට**

තරගකාරී හැඟීම් තවදුරටත් පවතී. සන්නිවේදන ක්ෂේත්‍රයන්හි විශේෂයි. බාධක මැද හෝ ප්‍රසිද්ධියක් සහිතව මූල්‍ය අවස්ථාවන් උදාවේ. උසස් අදහස් ඇති අය හා ඇසුරෙන් ප්‍රයෝජන අත්කර ගැනීමේ හැකියාව පවතී.

### කටක
**අවුල් සහගත සිතුවිලි**

අභිමානනීය පෞරුෂයක් බාහිරව පෙන්වීමට උත්සාහ ගත්තද සිතිවිලි අවුල් සහගත පැටළිලි බවක් ගෙන දෙනු ඇත. සතුරු උපක්‍රම, සෙම් අසනීප තත්ත්වයන් ගැන වඩාත් කල්පනාකාරීවන්න. මිල මුදල් හා කටයුතු කරන අයට ශුභයි.

### සිංහ
**පොදු කටයුතු**

බාධකයක් හෝ පසුබැසීම් අවස්ථා ඇතද ඊට කායිකව මුහුණ දීමට මානසික ශක්තිය පිටිවහලක් වනු ඇත. පොදු කටයුතුවලදී හැඟීම් සමබර වන සේ පාලනය කර ගැනීමට හැකිවේ. බාහිර ආශාවන් (භෞතික කටයුතු) තරමක් පැටළිලි සහගතය.

### කන්‍යා
**අපේක්ෂාවන් ඉටුවේ**

වියහියදම් අමාරුවෙන් හෝ පාලනය කරගත යුතු වේ. හැඟීම්, සිතිවිලි බොහෝදුරට හුදෙකලා බවත් හැඟේ. කිසියම් පාඩුවක් හෝ නැතිවීමක් ගැන පශ්චත්තාපී හැඟීම් ඇති කළ හැක. කෙසේ හෝ අපේක්ෂාවන් සාර්ථක කිරීමට උත්සාහ ගනී.

### තුලා
**අවිවේකී බවක්**

ලැබීම්වලට ඇති ඉඩකඩ බොහෝ සෙයින්ම අවුල් සහගත බවක් දැනේ. ඉක්මන් විසඳුම් ප්‍රතිඵල තවත් ප්‍රමාද කළ හැකිය. විශේෂයෙන් පොදු කටයුතු සම්බන්ධයෙනි. රාජ්‍ය අංශවල වැඩ කරන අයට අවිවේකී බවක් ඇතිවේ.

### වෘශ්චික
**කාර්ය බහුලවේ**

ආරක්ෂක, ක්‍රීඩා, පතල්, යාන්ත්‍රික වැනි ක්ෂේත්‍රවල වැඩකරන අයට කාර්ය බහුල වේ. ප්‍රමාදකාරී සිතිවිලි පාලනය කරගන්න. අන්‍යයන් හා බුද්ධිමත් හා කරුණික ලෙස කතා බස් කිරීමට අවස්ථාව උදාවිය හැකිය.

### ධනු
**සතුරු බලවේග**

තම ගෞරවනීය අනන්‍යතාවය තවදුරටත් සහතික කරමින් අන්‍යයන්ට කාරුණික වන සේ හැසිරීමේ ඉඩප්‍රස්ථාව ඇතිවේ. සතුරු බලවේග දුබල වේ. නැතිනම් පාලනය වේ. එසේත් නැත්නම් ඔවුන්ට අවස්ථා අහිමි වනු ඇත.

### මකර
**ගැටලු සහගතයි**

දවසේ කටයුතුවලදී කල්පනාකාරීව කතාබහ හසුරුවා ගන්න. බාධක සහිත කල්පනාවන් වියහියදම් ඇතිකරවනු ඇත. පාර්ශ්වීය සඳහා බොහෝදුරට ගැටලු සහගතයි. පාඩු සිදුවිය හැකිය. ඉතිරියකට ඇති ඉඩකඩ සීමා වේ.

### කුම්භ
**ශුභවාදී දිනයකි**

දවසේ හැසිරීම් රටාව ගැන මනා අවබෝධයකින් සිටීම අවශ්‍යයි. සිතිවිලි හැඟීම් වඩාත් ශුභවාදී වේ. එහෙත් මිල මුදල් ගැන කල්පනාකාරීව සැලකිලිමත් වන්න. ශරීර උෂ්ණත්වය, අස්ථි සම්බන්ධව අවධානය මැනවි.

### මීන
**උෂ්ණාධිකයි**

මිල මුදල් පරිහරණය, හරවත් ලෙස බස හැසිරවීම සුපුරුදු ලෙසම පවතිනු ඇත. වැඩකරන තැන්වල කාරුණික හැසිරීම කැපී පෙනෙනු ඇත. රුධිර සීනි මට්ටම ගැන පාලනයක් අවශ්‍යයි. ආමාශගත උෂ්ණාධික තත්ත්වයන් පාලනය කරගන්න.



# චක්‍රලේඛය අහෝසි නොකළොත් 03 වැනිදා වැඩවැරුමක්

## - සෞඛ්‍ය වෘත්තීය සමිති

■ චාමර පල්ලේගෙදර
■ වරුණී පෙරමුණ

සෞඛ්‍ය කාර්යය මණ්ඩලයට ඇති භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමේ අදහසින් පසුගිය 20 වැනිදා නිකුත් කළ චක්‍රලේඛය මෙතෙක් අත්හිටුවීමට පියවර නොගැනීම හේතුවෙන් ලබන 03 වැනිදා වැඩවර්ජනයක් සිදු කිරීමට සෞඛ්‍ය වෘත්තීය සමිති තීරණය කර ඇතැයි සෞඛ්‍ය වෘත්තීයවේදීන්ගේ විද්වත් සංගමයේ සභාපති රවී කුමුදේශ් පැවසීය.

එහිදී රෝගීන්ට ඇතිවිය හැකි සියලු අපහසුතාවයන්ගේ වගකීම සෞඛ්‍ය ලේකම්වරයා භාර ගත යුතු බවට සෞඛ්‍ය වෘත්තීය සමිති නායකයෝ අනතුරු අගවති.

පසුගිය 20 වැනිදා නිකුත් කළ අදාළ චක්‍රලේඛය අත්හිටුවීමට පියවර නොගතහොත් ඒකාබද්ධ වැඩවර්ජනයක් ක්‍රියාත්මක කරන බවට සෞඛ්‍ය වෘත්තීය සමිති විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් ජනක එස්. චන්ද්‍රගුප්තට පසුගිය 24 වැනිදා ලිඛිත දැනුම්දීමක් සිදුකර තිබිණි. ඒ අනුව අදාළ චක්‍රලේඛය යොදා ගනිමින් වෘත්තීය සංගම් නායකත්වය පීඩාවට ලක් කිරීමට උත්සහ දරන පළමු මොහොතේම දැවැන්ත වැඩවර්ජන ක්‍රියාවලියකට එළෙඹෙන බවද සෞඛ්‍ය වෘත්තීය සමිති විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාට යොමු කළ ලිපියේ සඳහන් විය.

සෞඛ්‍ය අයිතීන් රැක ගැනීමේ ඒකාබද්ධ අරගලයක් සිදු කිරීමට ඒකමතිකව තීරණය කරමින්, සෞඛ්‍ය වෘත්තීය සමිති 70කට අධික සංඛ්‍යාවක් විරෝධතා සංදේශයකට ද අත්සන් තබා එය සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් ජනක එස්. චන්ද්‍රගුප්තට පසුගිය 24 වැනිදා භාර දී තිබේ.

එලෙස දැනුම් දී තිබියදීත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා කිසිදු තැකීමක් නොකිරීම හේතුවෙන් මෙලෙස ලබන 03 වැනිදා වැඩවර්ජනයක් සිදු කරන බව ද රවී කුමුදේශ් මහතා සඳහන් කළේය.

# විගණකාධිපති ගොඩනැගිල්ලේ තඹ කම්බි කපලා

## - සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට

■ බිමල් ශ්‍යාමන් ජයසිංහ- බණ්ඩාරගම

ජාතික විගණකාධිපති දෙපාර්තමේන්තුව හා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පිහිටි බත්තරමුල්ල, පොල්දූව හන්දියේ ගොඩනැගිල්ලක භූගතව සවිකර තිබෙන අකුණු සන්නායක වයර් සහ තඹ කම්බි සොරකම් කළ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගත් බව බස්නාහිර පළාත් දකුණු දිසාව අපරාධ කොට්ඨාසය සඳහන් කළේය.

ජල ටැංකියේ ආරක්ෂාවට යොදා තිබෙන වයර්වලින් සැකකරුවන් එලෙස තඹ කම්බි කපා ඇතැයි පොලිසිය පැවසීය. රුපියල් ලක්ෂ 21ක් පමණ වටිනා අකුණු සන්නායක වයර් සහ තඹ කම්බි රාජගිරියේ පිහිටි පරණ අබලි ද්‍රව්‍ය මිලදී ගන්නා ස්ථානයනට සැකකරුවන් විසින් විකුණා තිබියදී පොලිසිය විසින් සොයාගෙන ඇත.

ජාතික විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරියකු කළ පැමිණිල්ලකට අදාළව සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබේ.

එලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ රාජගිරියේ පදිංචි අවුරුදු 23 සහ 24 වයසේ පදිංචි මත්ද්‍රව්‍යවලට තදින් ඇබ්බැහිවූවන් දෙදෙනෙකි. එම සැකකරුවන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

පොලිස් පරීක්ෂක සුමිත් ජයසිංහගේ උපදෙස් මත ඒකක එක ස්ථානාධිපති පොලිස් පරීක්ෂක හේමන්ත කුමාර ඇතුළු කණ්ඩායමක් වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# බාල තල තෙල් ලීටර් 800ක් පිටකොටුවේ වෙළෙඳසලක

■ චාමර පල්ලේගෙදර

පිටකොටුව ප්‍රදේශයේ මහා පරිමාණ සිල්ලර වෙළෙඳසලක බෙදාහැරීමට සූදනම් කර තිබූ භාවිතයට නුසුදුසු තල තෙල් ලීටර් 800කට අධික ප්‍රමාණයක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සොයා ගෙන තිබේ.

එම තල තෙල්වල සාම්පල රජයේ රස පරීක්ෂක වෙත අද (31 වැනිදා) ඉදිරිපත් කරන අතර එහි වාර්තා පැමිණෙන තුරු ඒවා වෙළෙඳම සහ බෙදාහැරීම තහනම් කළ බව එම අධිකාරියේ වැටලීම් අංශයේ නිලධාරියෙක් සඳහන් කළේය.

අදාළ තලතෙල් වලට රසායනික ද්‍රව්‍ය මිශ්‍ර කර අලෙවි කරන බවට ලද තොරතුරක් මත වැටලීම සිදු කෙරිණි.

මේ අතර මිරිස් කුඩු හා කහ කුඩු ඇතුළු කුළුබඩුවලට විවිධ පිටි වර්ග කලවම් කර බෙදා හැරි කොළඹ තොටළඟ, සේදවත්ත ප්‍රදේශයේ පවත්වාගෙන ගිය කුළුබඩු ඇඹරුම්හල් තුනකට එම අධිකාරිය විසින් මුද්‍රා තබා ඇත. රුපියල් ලක්ෂ 10කට අධික කුළුබඩු එහි තිබූ බවද එම නිලධාරියා පැවසීය.

මෙම ස්ථානයේදී මිරිස් කුඩු වලට බඩඉරිඟු පිටි, පාන් කුඩු, හාල් පිටි කලවම් කර රතු පැහැ ගැන්වීම සඳහා වර්ණකයක් යොදා සැර ලබාගැනීම සඳහා බෝල මිරිස් ද කලවම් කර ඇතැයි පැවසේ.

එමෙන්ම කහ කුඩු වලට හාල් පිටි සහ කහ පැහැති වර්ණකයක් කලවම් කරන බවද එම අධිකාරියේ වැටලීම් අංශයේ නිලධාරියෙක් සඳහන් කළේය.

අනිකුත් කුළුබඩු වලට ද එවැනි දෑ කලවම් කර මහා පරිමාණයෙන් මෙම ජාවාරම සිදුකරගෙන ගොස් ඇතැයි අනාවරනය වී තිබේ.



නිල ටී ෂර්ටය හඳුන්වාදුන් අවස්ථාව

## ලුම්බිණි පා ගමන සැප්තැම්බරයේ

කොළඹ ලුම්බිණි විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය සංවිධානය කරන 'Step Forward' ලුම්බිණි පා ගමන සැප්තැම්බර් 23 වැනිදා පැවැත්වීමට නියමිත අතර, එහිදී භාවිතා කරන නිල ටී ෂර්ටය ජනගත කිරීම සහ පා ගමන පිළිබඳ දැනුවත් කිරීමේ මාධ්‍ය හමුවක් පසුගියදා විද්‍යාලයීය පරිශ්‍රයේදී පැවැත්විණි.

මෙම මාධ්‍ය හමුව සඳහා නියෝජ්‍ය විදුහල්පති චතුරිකා ඉලංගතිලක, ආදී ලුම්බිණියන්ගේ සංගමයේ සභාපති කැලුම් සුජිත් සහ ආදී නිළියන්ගේ සංගමයේ ලේකම් චන්න තිලකරත්න ඊට සහභාගි වූහ.

එම පා ගමනට විදුහල්පති ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය, පාසලේ සිසු සිසුවියන්, ආදී සිසුන්, දෙමාපියන් ඇතුළු සුබ පතන්නන් සහභාගී වීමට නියමිතය.

මෙම පා ගමනින් ලැබෙන ආදයමෙන් විද්‍යාලයේ ප්‍රධාන පිවිසුම නව ආකෘතියකට ඉදිකිරීමට ද ආදී ශිෂ්‍ය සංගමය බලාපොරොත්තු වෙයි.

# කෙසෙල්වත්තේ වෙඩි තැබීමකින් 20 හැවිරිදි තරුණයකු මරුට

■ එෆ්. අස්ලම්

යතුරුපැදියකින් පැමිණි පුද්ගලයන් දෙදෙනකු කොළඹ, කෙසෙල්වත්ත, මාටිස් පටුමගේදී ඊයේ (30 වැනිදා) සවස සිදු කළ වෙඩි තැබීමකින් 20 හැවිරිදි තරුණයකු මියගොස් තිබේ.

මෙලෙස මියගොස් ඇත්තේ කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිව සිටි කාවින්ද දිල්ශාන් නමැති තරුණයෙකි. මෙම තරුණයා තවත් මිතුරන් දෙදෙනකු සමගින් මාර්ගයේ රැඳී සිටියදී මෙම වෙඩි තැබීම සිදුව ඇති අතර, ඉන් බරපතළ තුවාල ලත් තරුණයා කොළඹ ජාතික රෝහල වෙත ඇතුළත් කිරීමෙන් පසු මියගොස් තිබේ.

වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. කෙසෙල්වත්ත පොලිසිය ඇතුළු පොලිස් කණ්ඩායම් කිහිපයක් වැඩිදුර පරීක්ෂණ සිදුකරති.

# සනෝජා බිබිලේගේ නිවැරැදි කිරීමයි

2023/03/13 දින 'ගණිකා මඩමේ ලයිට් බිලෙන් නිළිය එළියට එයි' ශීර්ෂය යටතේ පළ වූ පුවත සම්බන්ධයෙන් සනෝජා බිබිලේ මහත්මිය විසින් කරන ලද පැහැදිලි කිරීමක් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ දී ඇති වූ එකඟතාවක් අනුව මීට පෙර පළ කරන ලද අතර එහි කර්තෘ සටහන සඳහන් වීම සම්බන්ධයෙන් පැමිණිලිකාර පාර්ශ්වයේ විරෝධතාව එල්ල වූ බැවින් ඒ අනුව එම පැහැදිලි කිරීම නැවත මෙසේ පළ කර සිටිමු.

එම පුවතෙහි සඳහන් දේපළෙහි ඇය ද එක් හිමිකාරියක් වුව ද එකී නිවසේ පවත්වාගෙන ගියා යැයි සැක කරනු ලබන ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇගේ කිසිම සම්බන්ධයක් හෝ අනුදැනුමක් නොමැති බව මෙන්ම ඉහත කරුණ සම්බන්ධයෙන් ඇයව, මහනුවර අපරාධ විමර්ශන ඒකකය වෙත කැඳවා නොමැති බවත් අදාළ දේපළෙහි විදුලි බිල්පතේ ඇගේ නම සඳහන් නොවන බවත් දන්වා ඇත.

එම පුවත පළ වූ ආකාරය මත යම් අයකු තුළ වැරැදි අවබෝධයක් ඇති වීමෙන් ඇයට යම් හානියක් සිදු වී ඇත්නම් ඒ පිළිබඳව අපගේ කනගාටුව ප්‍රකාශ කරමු.

# ඩෙංගු මර්දන ඒකකයෙන් කුඩම්මාගේ සැලකිලි

## - PHI සංගමයෙන් චෝදනා

## ගැටලුවක් ඇත්නම් සාකච්ඡාවට සූදානම්

### - ජාතික ඩෙංගු මර්දන ඒකකයේ අධ්‍යක්ෂ කියයි

■ ජුඩ් සමන්ත - පුත්තලම

ජාතික ඩෙංගු මර්දන ඒකකයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් තිදෙනකු සේවය කළද අනුප්‍රාප්තිකයන් නොමැතිවීම හේතුවෙන් මේ වන විට ඔවුන් වෙනත් ස්ථානවලට මුදාහැර ඇතැයි ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ පැවසීය.

මේ වන විට ජාතික ඩෙංගු මර්දන ඒකකය ඔවුන්ගේ සියලුම ක්‍රියාවලිවලින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කපා හැර දමා වෛද්‍ය නිලධාරීන්ගෙන් පමණක් සියල්ල කළ හැකිය යන මතයේ සිට කටයුතු කිරීම මෑත කාලයේ තමා නිරීක්ෂණය කළ බවද උපුල් රෝහණ මහතා පෙන්වා දුන්නේය. ජාතික ඩෙංගු මර්දන ඒකකය නිකුත් කරන කිසිම චක්‍රලේඛයක මහජන සෞඛ්‍ය පරීක්ෂක (PHI) නාමයවත් සඳහන් නොකර සිටීමට තරම් එම ඒකකය කුහක වී තිබෙන බවද ඔහු කීවේය.

ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපතිවරයා ප්‍රකාශ කර සිටියේ රුපියල් මිලියන ගණන් වියදම් කර තරු පංතියේ හෝටල්වල පුහුණු වැඩසටහන් සංවිධාන කරන ජාතික ඩෙංගු මර්දන ඒකකය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙනුවෙන් එක් පුහුණු වැඩසටහනක්වත් සංවිධාන නොකරන බවයි. එහෙත් ඩෙංගු මර්දනය වෙනුවෙන් ක්ෂේත්‍රයේ ප්‍රධානම කාර්යයක් ඉටු කරන නිලධාරියා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා බව ඩෙංගු මර්දන ඒකකය සිතාමතාම අමතක කර දමා ඇති බවට උපුල් රෝහණ මහතා චෝදනා කළේය.

වෙනත් වැඩසටහන්වලට රුපියල් මිලියන ගණන් වියදම් කරන එම ඒකකය, ඉන්ධන මිල මෙතරම් ඉහළ මට්ටමක තිබියදී අවම වශයෙන් ඉන්ධන වෙනුවෙන් සුළු දීමනාවක් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙනුවෙන් ලබාදීමටවත් කටයුතු කර නැතැයි ද හෙතෙම කීවේය.

ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය එල්ල කරන මෙම චෝදනා සම්බන්ධයෙන් ජාතික ඩෙංගු මර්දන ඒකකයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය නලීන් ආරියරත්නගෙන් විමසීමේදී ඔහු පැවසුවේ මෙතෙක් එම සංගමය විසින් තමාගෙන් සාකච්ඡාවක් ඉල්ලා නැති බවයි. එහෙත් ගැටලුවක් ඇති ඕනෑම අවස්ථාවක මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය ඉල්ලීමක් කරන්නේ නම් ඔවුන් සමග සාකච්ඡා කිරීමට තමන් සූදනම් බව ද ඒ මහතා පැවසීය. තවද, ඩෙංගු මර්දනය වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඉටුකරන විශිෂ්ට සේවාව අගය කරන බවද අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

# මින් ඉදිරියට බෙහෙත් ගන්නේ
# ඖෂධ අධිකාරියේ ලියාපදිංචි සැපයුම් කරුවන්ගෙන් පමණයි




## - සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වෛද්‍ය සමන් රත්නායක

■ කමල් සුරවීර - මහනුවර

**සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය ඖෂධ හා උපාංග මින් ඉදිරියට ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන් මගින් පමණක් මිලට ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කර ඇත. ඉදිරියේදී මිලට ගැනීම සඳහා අපේක්ෂා කරන ඖෂධ හා උපාංග සැපයීම සඳහා ටෙන්ඩර් දැමීමේ දී ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන්ට පමණක් ඒ සඳහා ඉදිරිපත් වන ලෙස දැනුම් දී තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වෛද්‍ය සමන් රත්නායක පවසයි.**

සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා දැනට භාණ්ඩාගාරයෙන් ලබාදෙන මුදල් ප්‍රමාණවත් නොමැති බවත් මේ සම්බන්ධව ජනපතිවරයා සමග කළ සාකච්ඡාවකින් පසු රුපියල් බිලියන 13ක් ලබාදීමට කටයුතු කරන බවට ඔහු පොරොන්දු වූ බවත් කී රත්නායක මහතා ඉන්පසු බොහෝ ගැටලුවලට විසඳුම් ලැබෙනු ඇතැයි අවධාරණය කළේය. දන්ත වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය ඖෂධ සහ උපාංග මිල දී ගනු ලබන්නේ ඖෂධ සංස්ථාව මගින් බවත් 2021 වසරේ දී එවැනි ඖෂධ හා උපකරණ 1700ක් පමණ ඇණවුම් කර තිබුණු බවත් කී ඒ මහතා ඩොලරයේ මිල ඉහළ යෑමත් සමඟ 2022දී ලබා ගැනීමට නියමිතව තිබූ එම ඇණවුම් සඳහා මිල සංශෝධනයක් කරන ලෙස සැපයුම්කරුවන්ගෙන් ඉල්ලීමක් ඉදිරිපත් වූ බවත් ප්‍රකාශ කළේය.

මෙම ක්ෂේත්‍රය සඳහා සැපයුම්කරුවන් සිටින්නේ ඉතා සීමිත පිරිසක් බවත් ඔවුන් ඉදිරිපත් කළ මිල ගණන් අනුව මිලදී ගැනීම් වෙනුවෙන් ඉතා විශාල මිල වැඩි වීමක් සිදුවූ නිසා අදළ ඇණවුම් සියල්ල අවලංගු කිරීමට සිදුවූ බවත් හෙතෙම අවධාරණය කළේය. යළි ටෙන්ඩර් මගින් අදළ ඖෂධ හා උපකරණ මිලට ගැනීම සඳහා වන ක්‍රියාවලියට අවම තරමින් මාස 09ක පමණ කාලයක් ගතවන බවත් අදළ සැපයුම්කරුවන් ගෙන්වා කළ සාකච්ඡාවකින් පසු හදිසි ප්‍රතිකාර සඳහා අවශ්‍ය ඖෂධ හා උපකරණ 270ක ලැයිස්තුවක් සකස් කළ බවත් වෛද්‍ය රත්නායක කීය. හදිසි මිලදී ගැනීම් සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ මෙම මිලදී ගැනීම් සිදු කරන බවත් ඒ සඳහා අවශ්‍ය පූර්ණ සහාය දන්ත වෛද්‍ය සැපයුම් කරුවන්ගෙන් ලැබී තිබෙන බවත් අතිරේක ලේකම්වරයා පැවැසුවේය. ඒ අනුව දැනට පවතින හිඟය මාස 04ක් වැනි කාලයකදී මග හැරෙණු ඇතැයිද ඒ මහතා ප්‍රකාශ කළේය.

# මුහුදු මහා විහාරයේ විහාරාධිකාරී හිමිට පහරදුන් සැකකරුවන් තවමත් නිදැල්ලේ

■ සුනිල් පියතිලක - කුරුවිට

පුරා විද්‍යා ස්ථානයක පිහිටි ලෙනක් තුළ භාවනානුයෝගීව වැඩ සිටි පොතුවිල් මුහුදු මහා විහාරයේ විහාරාධිකාරී උඩලමත්තේ රතනප්‍රිය හිමි මැර ප්‍රහාරයකට ලක්ව පසුගිය 28 වැනිද රාත්‍රියේ අම්පාර රෝහල වෙත ඇතුළත් කර තිබේ. තමන් සුපුරුදු පරිදි පසුගිය 28 වැනිද රාත්‍රියේ සර්වෝදයපුර පුරා විද්‍යාස්ථානයේ ලෙනට වැඩ සිටි බවත් ඒ අවස්ථාවේ පුද්ගලයන් අට දෙනකු පමණ පැමිණ තමාට පහරදී රුපියල් පනස් හත්දහසක් වටිනා ජංගම දුරකතනය හා බුදු පිළිමය පැහැර ගෙන ගිය බව උන්වහන්සේ පොතුවිල් පොලිසියට කර ඇති පැමිණිල්ලේ සඳහන්ය. තමාට පහරදීමට පැමිණි පිරිස අතර අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජාතික පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සහ ප්‍රාදේශීය සභා සභාපතිවරයකුද සිටි බවත් ඔවුන් දෙදෙනා බලා සිටියදීම පහරදීම සිදුවූ බවත් තමාට පහරදුන් පිරිස වැඩේ හරි සර් කියා ජංගම දුරකථනය රැගෙන ගිය බවත් උන්වහන්සේ සඳහන් කර ඇත. මේ සම්බන්ධයෙන් පොතුවිල් පොලිසිය පුළුල් විමර්ශනයක් ආරම්භ කර තිබේ. ඊයේ (30 වැනිද) සවස් වනවිටත් එකදු සැකකරුවකු හෝ අත්අඩංගුවට ගෙන නොතිබිණි. කෙසේ නමුත් සැකකරුවන් කිහිප දෙනකු හඳුනාගෙන තිබෙන බව පොලිස් නිලධාරියෙක් කීවේය.

# විශ්‍රාමික යුද සෙබළෙක් විශ්‍රාමික සිවිල් භටයකුට උදැල්ලකින් ගසා මරලා

■ සිඩ්නි රුවන් උඩේපාල - කහටගස්දිගිලිය

විශ්‍රාමික සිවිල් ආරක්ෂක භටයකුට උදැල්ලකින් පහරදී මරණයට පත් කර ප්‍රදේශයෙන් පලා ගොස් ඇති විශ්‍රාමික යුද හමුද සෙබළෙකු සොයා කැබිතිගොල්ලෑව පොලිසිය විමර්ශනයක් ආරම්භ කර ඇත. දීර්ඝ කාලයක සිට පැවැති පෞද්ගලික ආරවුලක් මුල්කර ගනිමින් මෙම ඝාතනය සිදු කර ඇති බවට සැකකෙරේ. මෙලෙස මියගොස් ඇත්තේ 62 හැවිරිදි මහකටුවරගාල වැව, තිත්තගෝනෑවේ පදිංචි විශ්‍රාමික සිවිල් ආරක්ෂක භටයෙකි.

පෞද්ගලික ආරවුල මුල්කර ගනිමින් මෙම ගැටුම පසුගිය 28 වැනිද සවස තිත්තගෝනෑව ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික වී මෝලක් තුළදී සිදුව ඇත. ඔවුන් දෙදෙනා වී කෙටීම සඳහා වී මෝල වෙත පැමිණ ඇති අතර අනතුරුව එහිදී දෙදෙනා අතර බහින් බස් වීමක් සිදුව ඇත. එම අවස්ථාවේදී සැකකාර විශ්‍රාමික යුද්ධ හමුද සෙබලා විශ්‍රාමික සිවිල් ආරක්ෂක භටයාගේ හිසට උදැල්ලකින් පහරක් එල්ල කර ඇත.

එම පහරින් දැඩි ලෙස තුවාල වූ විශ්‍රාමික සිවිල් ආරක්ෂක භටයා තම දිවි ගලවා ගැනීමේ අරමුණින් වී මෝල ඇතුළට දිවගොස් ඇති අතර එය තුළටද හමුද සෙබලා පැමිණ නැවත පහර දී තිබේ. බරපතළ තුවාල ලබා සිටි විශ්‍රාමික සිවිල් ආරක්ෂක භටයා අනතුරුව ප්‍රදේශවාසීන්ගේ උදවු උපකාර මත කැබිතිගොල්ලෑව රෝහල වෙත ඇතුළත් කර වැඩි දුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත මාරු කර යවා තිබේ. එහි ප්‍රතිකාර ලබමින් සිටියදී ඔහු මියගොස් ඇත.

# උතුරුමැදට පිටින් එන ගුරුවරු උගන්වනවාට වඩා උත්සාහ කරන්නේ මාරුව හදාගන්න



## - ආණ්ඩුකාර මහීපාල හේරත්

■ සුමේධ කරුණාරත්න - අනුරාධපුර

**උතුරුමැද පළාතට පිට පළාත්වලින් පැමිණෙන ගුරුවරුන් වෙහෙසෙන්නේ පාසල්වල ඉගැන්වීමට නොව ස්ථාන මාරුව ගම් පළාතට ලබාගැනීමට බව උතුරුමැද ආණ්ඩුකාර මහීපාල හේරත් පැවසීය. මේ හේතුවෙන් ගුරු හිඟය තව තවත් වර්ධනය වී ඇති බවද ආණ්ඩුකාරවරයා සඳහන් කළේය. ආණ්ඩුකාරවරයා මේ බව ප්‍රකාශ කළේ පසුගියදා පැවැති අනුරාධපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදීය.**

එමෙන්ම පළාතේ අධ්‍යාපනය නැංවීම සඳහා මේ වනවිට විශේෂ ව්‍යාපෘති කීපයක් ආරම්භ කර තිබුණද ඊට ප්‍රධාන බාධාවක්ව පවතින්නේ පළාතේ ගුරු හිඟය බවත් මේ වනවිට ගුරුවරුන් 3,200කගේ හිඟයක් පවතින බවත් හෙතෙම කීවේය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප පහේම උසස් පෙළ විද්‍යා, ගණිත අංශයන්හි ප්‍රතිඵල පහළ මට්ටමක පවතින බවත් ඒ හේතුවෙන් උතුරුමැද පාළාත් පාසල්වල එම අංශයේ ප්‍රතිඵල ඉහළ නැංවීමේ අරමුණින් විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන බවත් මෙම රැස්වීමේදී උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විද්‍යා/ගණිත) ටී. බී. එස්. ජිනාදරී සඳහන් කළාය.


# හොර ඔප්පුවකින් ඉඩම් පවරා ගත් සැකකරුවෙක් කොටු

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

ව්‍යාජ ඔප්පු මගින් ඉඩම් දෙකක් පවරා ගැනීම සහ ව්‍යාජ ඔප්පුවක් ඉදිරිපත් කර රුපියල් ලක්ෂ 15ක මුදලක් වංචා කිරීම සම්බන්ධයෙන් 72 හැවිරිදි පුද්ගලයකු මාලිගාවත්ත ප්‍රදේශයේදී කොළඹ වංචා විමර්ශන අංශය විසින් අත්අඩංගුවට ගනු ලැබීය. සැකකරු පදිංචිව සිටි නිවසේ තිබී අන්සතු විදේශ ගමන් බලපත්‍රයක්, අන්සතු රියැදුරු බලපත 11ක්, ජාතික හැඳුනුම්පත් 4ක් සොයාගෙන ඇත.

ඊට අමතරව විවිධ පොලිස් ස්ථාන, අධිකරණ, රෝහල්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පාසල් හා බන්ධනාගාර, බැංකු, තක්සේරු දෙපාර්තමේන්තුව, ආදායම් බදු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, විදුහල්පතිවරු, ග්‍රාම නිලධාරින් සහ වෛද්‍යවරුන් ඇතුළු විවිධ ක්ෂේත්‍රවලට අදළ ව්‍යාජ නිල මුද්‍රා 300කට ආසන්න ප්‍රමාණයක්ද පොලිස් භාරයට ගෙන තිබේ.





# මුරකරුට පහර දී හංගාගෙන සිටියැයි විදුහල්පතිවරයකුට චෝදනා

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

ගල්කිස්ස ප්‍රදේශයේ විදුහලක විදුහල්පතිවරයකුගේ අමානුෂික පහර කෑමට ලක්වූ බව කියන එම විදුහලෙහි රාත්‍රි මුරකරු ලෙස කටයුතු කරන 27 හැවිරිදි තරුණයකු අසාධ්‍ය තත්ත්වයෙන් රෝහල්ගත කර ඇත. මෙලෙස රෝහල් ගතකර ඇති තරුණයා එම පාසලේ වසර තුනක පමණ කාලයක සිට රාත්‍රි මුරකරු ලෙස සේවය කර තිබේ. හොරණ පදිංචි එම තරුණයාගේ මව පසුගිය 22 වැනිද දුරකථන ඇමතුමක් ගෙන කතා කළද එම අවස්ථාවේදී එය ක්‍රියා විරහිත වී තිබූ බැවින් නැවත 24 වැනිද විදුහල්පතිවරයාට ඇමතුමක් ලබා ගත් අවස්ථාවේදී ඔහු පවසා ඇත්තේ තරුණයාට අසනීප බවය.

එවිට විදුහල්පතිවරයාට ඇය පවසා ඇත්තේ සිය පුතුව රෝහලට රැගෙන යන ලෙසය. ඇය නැවත එම දුරකතනයට කතා කිරීමේදී දැනගන්නට ලැබී ඇත්තේ පුතු රෝහලට රැගෙන ගිය බවය. එය දැනගත් මව දකුණු කොළඹ මහරෝහල වෙත ගොස් ඇති අතර එහිදී තරුණයා චෝදනාකර ඇත්තේ විදුහල්පතිවරයා රාත්‍රි කාලයේදී මත්පැන් පානය කර ඔහු අසලට පැමිණ පහරදී පියගැට පෙළින් පහළට තල්ලු කළ විට තමාට සිහි විසඤ වූ බවය. එමෙන්ම තමන්ව විදුහල්පතිවරයාගේ කාර්යාලය පිටුපස වත්තේ දින තුනක් හොර රහසේ තබා ගෙන ප්‍රතිකාර ලබා නොදී ස්නානය කරවූ බවටද ඔහු චෝදනා කර ඇත. එම තරුණයාගේ සුෂුම්නාවට දැඩි ලෙස හානි සිදුවී ඇත. ඔහුට ඇවිදීමට පවා නොහැකි වනු ඇති බවට සැක කරන බව වෛද්‍යවරුන් පවසා තිබේ. අසාධ්‍ය තත්ත්වයෙන් කළුබෝවිල ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි තරුණයා පෙරේද (29 වැනිද) වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු ඒකකය වෙත යොමුකර ඇති බව ඥාතීහු පවසති. රාත්‍රි කාලයේදී විදුහල්පතිවරයාගේ මිතුරන් පාසල වෙත ගෙන්වා පවත්වන මත්පැන් සාද සඳහා කට ගැස්ම සකස් කරගෙන ඇත්තේ මෙම තරුණයා ලවා බවටද ඥාතීහු චෝදනා කරති. මේ පිළිබඳව ඉකුත් විසිපස් වැනි දින ගල්කිස්ස මූලස්ථාන පොලිසිය වෙත පැමිණිලි කළද මෙතෙක් නීතියේ පිහිටක් නැතැයි ඥාතීහු වැඩිදුරටත් චෝදනා කරති.



පහර කෑ මුරකරු

## ඔහු මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවෙක්; චෝදනා ප්‍රතික්ෂේප කරනවා

- විදුහල්පති

## පැමිණිල්ල සහ සාක්ෂි පරස්පරයි

- ගල්කිස්ස පොලිස් ස්ථානාධිපති

මේ පිළිබඳව එම විද්‍යාලයේ විදුහල්පතිවරයාගෙන් විමසීමේදී ඔහු සඳහන් කළේ රාත්‍රි මුරකරු ලෙස සේවය කරන තරුණයා දැඩි ලෙස මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවෙක් බවත් ඥාතීන් කරන සියලු චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්ය. මේ වනවිට සිදු කරන විමර්ශනවලට අනුව පැමිණිල්ල සහ ලැබෙන සාක්ෂි පරස්පර බව ගල්කිස්ස මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක දිලිප පෙරේරා සඳහන් කළේය.

# හෙරොයින් සැකකරුවෙක් සිර මැදිරියෙන් පලා යෑමෙන් සැරයන්ගේ වැඩ තහනම්

■ තිස්ස රවින්ද්‍ර පෙරේරා

හෙරොයින් සමග අත්අඩංගුවට ගත් සැකකරුවෙක් සිර මැදිරියෙන් පලා යෑම හේතුවෙන් රාජකාරි භාරව සිටි සැරයන්වරයාගේ වැඩ තහනම් කර තිබේ. වැසිකිළි යෑමට පිටතට ගෙන යළි එය තුළට දැමීමෙන් පසු ඉබි යතුරු නොදැමීම නිසා සැකකරු පලාගොස් ඇත. බේරුවල පොලිසියට අනියුක්ත පොලිස් සැරයන්වරයකු මෙසේ වැඩ තහනමට ලක් කර ඇත්තේ සැකකරුවන්ගේ ආරක්ෂාව නොතකා හැරීම හා රාජකාරිය පැහැර හැරීමේ චෝදනාවටය. හෙරොයින් ග්‍රෑම් පහකුත් මිලිග්‍රෑම් 820ක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධව අත්අඩංගුවට ගත් පයාගල, හොරගස්කැලේ පදිංචි සැකකරුවකු මෙසේ පලාගොස් තිබේ.


ජූලි මාසයේ ජයග්‍රහණයේ ඇත්ත කතාව
රු. කෝටි හතකට ආසන්න මුදලක්
(රු. 69,351,040/-)
ජයග්‍රාහකයින් 794,838ක් අතර බෙදාදුන් වගයි.
මහජන සම්පත
ලකී 7
Lucky 7
රු. ලක්ෂ 25 ජයග්‍රහණ 2 ක්
ගම්පොලට
811 කෙටි පණිවුඩ සේවාව
යතුරුපැදි ජයග්‍රහණ 2 ක්
මහනුවරට
අම්පාරට
iPhone ජයග්‍රහණ 1 ක්
කළුතරට
ලක්ෂපතියන් 52 ක්
රන් පවුම් ජයග්‍රාහකයින් 02 ක්
0970200
0110116
0179005
0975233
0976552
0607010
26116

# EPF ප්‍රතිලාභ අඩුවීමේ අවදානමක්

## අධ්‍යයනයකින් හෙළිවෙලා

■ ඉෂාර රත්නකාර

සේවක අර්ථසාධක අරමුදල විසින් භාණ්ඩාගාර බිල්පත්වල සහ බැඳුම්කරවල සිදු කර ඇති ආයෝජන කඩිනමින් ප්‍රතිව්‍යුහගත නොකළහොත් එම අරමුදල මගින් ලබාදෙන ප්‍රතිලාභ අඩුවීමේ අවදානමක් ඇති විය හැකි බව අධ්‍යයනයකින් හෙළිවෙයි.

ආර්ථික අර්බුදයට විසඳුම් ලබාදීමේදී ක්‍රියාත්මක ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවලිය ඔස්සේ සේවක අර්ථසාධක අරමුදල මගින් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල කර තිබෙන ආයෝජන ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජිතය.

එමගින් සිදුවන බලපෑම සම්බන්ධයෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව හා සේවක අර්ථසාධක අරමුදල එක්ව විශේෂ අධ්‍යයනයක් ද සිදු කෙරේ. සේවක අර්ථ සාධක අරමුදල මගින් සිදුකර තිබෙන ආයෝජන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පවතින අවස්ථාවන් පිළිබඳව එහිදී අවධානය යොමු කර තිබේ.

එලෙස ප්‍රතිව්‍යුහගත නොකර අනෙකුත් මූල්‍ය ආයතනවලට බලපාන ආකාරයට ආදායම මත සියයට තිහක (30%)ක බද්දක් පැනවුවහොත් සේවක අර්ථසාධක අරමුදල මගින් ලබාදෙන ප්‍රතිලාභ අඩුවීමේ අවදානමක් පවතින බවද මෙහිදී අනාවරණය වී ඇත.

මේ වනවිට සියයට දහතරක් (14%) ක් අය කරනු ලබන බද්ද සියයට තිහ (30%) දක්වා ඉහළ දැමුවහොත් එම බද්ද දීර්ඝ කාලීනව ගෙවීමට සිදුවන බවද මෙහිදී අවධානයට ලක්ව ඇත.

අනෙකුත් මූල්‍ය ආයතනවලට බලපාන ආකාරයට සියයට තිහක බද්දක් ගෙවනවාද එසේ නොමැතිනම් සියයට දහතරක බදු ප්‍රතිශතය පවත්වා ගනිමින් දැනට ලබාදෙන ප්‍රතිලාභ ලබාදෙනවා ද යන්න සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සියලුම පාර්ශ්වවල එකඟතාවෙන් සිදු කිරීමට නියමිත බව වාර්තා වෙයි.

# ලාංකිකයන්ගේ ඇස්වලින් ලොව පුරා 1767දෙනකුට පෙනීම



■ සුනිල් රූපසිංහ - පල්ලේපොල

මෙම වසරේ ඊයේ (28 වැනිදා) දක්වා ශ්‍රී ලංකිකයින් විසින් රටවල් 57ක පුද්ගලයින් 1767දෙනකුට පෙනීම ලබාදීමට දායක වී ඇතැයි ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමය සඳහන් කරයි.

ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමයේ ජ්‍යෙෂ්ඨ කළමණාකරු ජගත් සමන් මාතරආරච්චි 'අරුණ' කළ විමසීමේදී පැවසුවේ ජපානය, ඊජිප්තුව, පාකිස්තානය, තායිලන්තය, මැලේසියාව සහ සිරියාව ඇතුළු රටවල් 57ක නගර 117ක දෑසම හෝ එක් ඇසක් නොපෙනෙන පුද්ගලයින් සඳහා ලාංකිකයින් මෙලෙස ඇස් පරිත්‍යාග කර ඇති බවයි.

මෙරට අක්ෂි වෛද්‍යවරුන්ගේ නිර්දේශවලට අනුව ශ්‍රී ලාංකිකයින් 541දෙනකුට ද මෙලෙස ඇස් පරිත්‍යාග කර තිබේ.

එක් ඇසක් හෝ දෑසම නොපෙනෙන දෙස් විදෙස් ඕනෑම පුද්ගලයකුට වෛද්‍ය නිර්දේශ අනුව නොමිලේ ඇස් සැපයීමට ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමය ඉදිරිපත්වී සිටින බවද ජගත් සමන් මාතරආරච්චි මහතා පැවැසීය.

තවද ඇස් දන්දීමට ඇති ඉහළම කැමැත්ත ශ්‍රී ලාංකිකයින් විසින් දක්වා ඇති බවත් මේ වනවිට ඇස් දන්දීමට ලාංකිකයින් ලක්ෂ 22ක් සිය කැමැත්ත ප්‍රකාශ කර තිබෙන බවත් හෙතෙම කීවේය.

# උඩවලව ජාතික උද්‍යානයේ වැව්,පොකුණු සිඳී ගිහින්



■ සාලිය කුමාර ගුණසේකර

මේ දිනවල පවතින දැඩි වියළි කාලගුණික තත්වය හේතුවෙන් උඩවලව ජාතික උද්‍යානයේ වැව්,පොකුණු රැසක් සිඳී ගොස් ඇතැයි පරිසරවේදීහු කියා සිටිති.

අලි ඇතුන් ජලාශවලට ගොස් ජලය සොයා ගනු ලැබුවත් කුඩා සතුන් රැසක් ජලය නොමැතිව අසරණවී සිටිති.

ජාතික උද්‍යානයේ අභ්‍යන්තර මඩ වළවල්, කෘත්‍රිම මඩ පොකුණු, කුඩා වැව් ආදිය සිඳී ගොස් ඇතැයි පරිසරවේදී සමීර වීරතුංග පවසයි.මෙම කුඩා වැව් පොකුණු පෝෂණය ලබන්නේ වර්ෂාවෙනි.

මෙලෙස සිඳී ගිය මඩ පොකුණු ආදිය ජලයෙන් පිරවීම පරිසරවේදීන් ඇතුළු කණ්ඩායම් මේ දිනවල සිදුකරනු ලබන්නේ දැඩි අපහසුතා මධ්‍යයේය.

# පැමිණිල්ලක් දාන්න ගිය බිරිඳ පසු පස ආ සැමියා පොලිසිය ළඟදී වහ බීලා

■ සුරංග රාජනායක - ගම්පොළ

ගම්පොල පුපුරැස්ස පොලිසිය දෙරකඩට පැමිණි පුද්ගලයකු වස පානය කරමින් සිටියදී පොලිස් නිලධාරින් එක්ව වස කුප්පිය උදුරා එම පුද්ගලයා රෝහල් ගත කර තිබේ.

එසේ වස පානය කර ඇත්තේ පන්විලතැන්න රජතලාව ප්‍රදේශයේ පදිංචි 28 හැවිරිදි එක්දරු පියෙකි.

දීර්ඝ කාලයක් තිස්සේ පවතින ආරවුලක් දුරදිග ගොස් ඔහුගේ බිරිඳ ඒ සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට ගම්පොළ පුපුරැස්ස පොලිසිය වෙත ගොස් තිබේ. මොහු ද ඇය පිටුපසින් ගොස් ඇති අතර බිරිඳ පොලිසිය තුළට ගොස් පැමිණිල්ල සිදු කරමින් සිට ඇත.

ඒ අවස්ථාවේදී මෙම පුද්ගලයා පොලිස් දෙරකඩට ගොස් සඟවාගෙන සිටි වස බෝතලයක් රැගෙන එය එකවර කටට හලාගෙන ඇති අතර එය දුටු පොලිස් නිලධාරීන් වහා පැන එය උදුරාගෙන තිබේ.මෙම අඹුසැමියන් දෙදෙනා මීට වසර පහකට පමණ පෙර කොළඹ රැකියා ස්ථානයකදී දැන හඳුනාගෙන විවාහ වී ඇති බව පොලිස් පරීක්ෂණවලින් අනාවරණය වී තිබේ.

මේ වන විට වයස අවුරුදු 4ක පමණ දරුවකුද සිටින අතර එම බිරිඳ මීට පෙර ද පුපුරැස්ස පොලිසිය වෙත පැමිණිලි හයක් සිදු කර තිබෙන බව පැවසේ. වස පානය කිරීමෙන් පසු පොලිසිය එක්ව මොහු පන්විලතැන්න රෝහලට ඇතුළත් කොට ඇති අතර පසුව ඔහු ගම්පොල ශික්ෂණ රෝහලට මාරු කර තිබේ.

# ජූලි මාසයේදී ඩෙංගු රෝගීන්ගේ අඩුවීමක්

## - ජාතික ඩෙංගු මර්දන ඒකකය

■ වරුණි පෙරමුණ

ජූලි මස ආරම්භයේ සිට ඊයේ (30 වැනිදා) දක්වා කාලයේදී ඩෙංගු රෝගීන් හයදහස් නවසිය අටදෙනකු වාර්තා වී ඇතැයි ජාතික ඩෙංගු මර්දන ඒකකය සඳහන් කරයි.

ඒ අනුව පසුගිය මාසයට සාපේක්ෂව ඩෙංගු රෝගීන් සංඛ්‍යාවේ අඩුවීමක් දක්නට ලැබෙන අතර, ජුනි මාසයේදී වාර්තා වී තිබුණේ ඩෙංගු රෝගීන් නවදහස් නවසිය දසයදෙනකු පමණි.

ඊයේ (30 වැනිදා) දක්වා මෙම වසරේ ගතවූ කාලයේදී ඩෙංගු රෝගීන් පනස් හයදහස් දෙසිය විසි අටදෙනකු වාර්තා වී තිබූ අතර, ඉන් වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වී තිබුණේ බස්නාහිර පළාතෙනි. එම සංඛ්‍යාව විසිහත්දහස් අටසිය අසූනනකි. එම පිරිසෙන් බහුතරය ගම්පහ දිස්ත්‍රික්කයේ රෝගීන් වන අතර එම සංඛ්‍යාව දොළොස්දහස් එකසිය පනස් හතරකි. මේ අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස පනස් දෙකක් ඩෙංගු අධි වසංගත කලාප ලෙස නම්කර තිබේ.

# සැක කටයුතු ගල්, ඉල්ලම් පස් උර දෙකක් සමග අයෙක් කොටු

■ ප්‍රදීප් සමන්ත-පුත්තලම

මැණික් ගල්වලට සමාන ගල් කැට සහිත උරයක් සහ ඉල්ලම් පස් යැයි සැකකළ හැකි පස් සහිත උරයක් මෝටර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයකු මුන්දලම පොලිසියේ නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

29 වැනිදා රාත්‍රී 10.00 ට පමණ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත්තේ මූණමල්දෙණිය - හුණුපොල ප්‍රදේශයේ පදිංචි (අවු:29) පුද්ගලයෙකි.

රාත්‍රී මුර සංචාරයේ නිරතව සිටි මුන්දලම පොලිසියේ නිලධාරින් පුත්තලම - කොළඹ මාර්ගයේ ගමන් කරමින් තිබූ මෝටර් රථයක් නවත්වා පරීක්ෂා කර ඇත. එම මෝටර් රථය තුළ මැණික් ගල්වලට සමාන කුඩා ගල් සහිත උරයක්ද, ඉල්ලම් පස් බවට සැකකළ හැකි පස් සහිත උරයක්ද තිබී ඇත. ඒ සම්බන්ධයෙන් මෝටර් රථයේ රියැදුරුගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු විසින් පරස් පර ප්‍රකාශයන් සිදු කර ඇත.

ඒ අනුව මෝටර් රථය පැදවූ පුද්ගලයා අත්අඩංගුවට ගෙන ඇති පොලිස් නිලධාරින්,මෝටර් රථය, එහි තිබූ ගල් සහිත උරය සහ පස් පුරවා තිබූ උරයද තම භාරයට ගෙන ඇත. කිසියම් ස්ථානයක කැණීම් සිදු කිරීමෙන් අනතුරුව හමුවී ඇති ගල් සහ එම ස්ථානයේ තිබූ පස් සැකකරු විසින් රැගෙන යමින් තිබූ බවට විශ්වාස කරන්නේ යැයි පොලිසිය කියයි.

මුන්දලම පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු කරගෙන යයි.



පොලිස් භාරයට ගත් සැකකටයුතු ගල්

# ඉන්දු - ලංකා ආදි සිසුන්ට ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයෙන් නව වෙබ්අඩවියක්

ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතනවල ආදි ශිෂ්‍යයන් සම්බන්ධ කිරීමේ අරමුණෙන් ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් 'Indo-Lanka Edu Net' නමින් වෙබ්අඩවියක් පෙරේද (29 වැනිදා) එළිදැක්වීය.

කොළඹ මැන්ඩරිනා හෝටලයේදී පැවැති උත්සවයකදී මෙම වෙබ්අඩවිය නිල වශයෙන් එළි දැක්වූයේ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය අංකුරන් දත්තා විසිනි.

දෙරටේ සිසුන්ගේ සහයෝගිතාව වර්ධනය කිරීමේ සහ අධ්‍යාපන අවස්ථා නිර්මාණය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ පදිංචි ඉන්දියානු විශ්වවිද්‍යාලවල ආදි සිසුන්ගේ ජාලයක් පිහිටුවීම මෙහි අරමුණයි. සෑම වසරකම ඉන්දියාවෙන් මෙරටට ලබා දෙන ශිෂ්‍යත්ව ඇතුළු අධ්‍යාපන අවස්ථා පිළිබඳව සහ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පිරිස් දැනුවත් කිරීමේ වේදිකාවක් ලෙසද මෙම වෙබ් අඩවිය ක්‍රියාත්මක වේ.

බොහෝදෙනා විශ්වාස කරන්නේ ශ්‍රී ලංකාව හැමවිටම ඉන්දියාව අනුගමනය කළ බව වුවද, ශ්‍රී ලංකාවේ සාර්ථක වූ විවිධ වැඩසටහන් ඉන්දියාව විසින්ද පසුකාලීනව අනුගමනය කර ඇති බව ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය අංකුරන් දත්තා මෙහිදී පැවසීය.

"ශ්‍රී ලංකාව හැමවිටම ඉන්දියාව දිහා බලාගෙන වැඩ කළා කියන එක සෑම අවස්ථාවකදීම සත්‍යයක් නොවෙයි. ඉන්දියාවත් ශ්‍රී ලංකාව දිහා බලලා බොහෝ දේ ක්‍රියාවට නංවනවා.'' යැයිද හෙතෙම කීවේය.

# සා.පෙළ ප්‍රායෝගික පරීක්ෂණ අනිද්දා ඇරැඹේ

සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ අනිද්ද (02 වැනිදා) සිට ලබන 12 වැනිදා දක්වා පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබේ.

සංගීත විෂයයෙහි ශ්‍රවණ පරීක්ෂණය ලබන 6 වැනිදා පැවැත්වෙන බව එම දෙපාර්තමේන්තුව නිවේදනය කරයි. පාසල් අයැදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර විදුහල්පතිවරුන් වෙත ද පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයන්ට ද තැපැල් කර තිබෙන බවත් එම නිවේදනයේ සඳහන් වෙයි.

මේ සම්බන්ධයෙන් යම් විමසීමක් අවශ්‍ය වන්නේ නම් 1911, 0112784208, 0112786616 යන දුරකථන අංකවලට අමතන ලෙස ඉල්ලීමක් කෙරේ.

# වලානේ යුනිට් එකෙන් කියා ඇවිත් සිසුවාගේ රන් මාලය කොල්ලකාලා

■ බිමල් ජයසිංහ -බණ්ඩාරගම

බුලත්සිංහල නගරයේ බස් නැවතුමේ සිටි 18 හැවිරිදි සිසුවකු රබර් වත්තකට රැගෙන ගොස් ඔහු හැඳ සිටි කමිසය ගලවා අත් දෙක බැඳ ගෙල පැළඳ සිටි රුපියල් එක්ලක්ෂ පනස් දහසක් පමණ වටිනා රන් මාලයක් කොල්ලකා පලා ගොස් ඇතැයි බුලත්සිංහල පොලිසිය කියයි.

සිසුවා පෙරේද (29) සවස අමතර පන්ති නිමවා නිවස කරා යාම සඳහා බස්නැවතුමේ රැඳී සිටියදී යතුරුපැදියෙන් පැමිණි පුද්ගලයන් දෙදෙනෙක් " අපි වලානේ යුනිට් එකෙන් " බව පවසා සිසුවා පරීක්ෂා කිරීමට අවශ්‍ය බව කියා ඔහු යතුරු පැදියේ මැද නංවාගෙන දෙඩම්ගොඩ පාළු රබර් වත්තකට රැගෙන ගොස් තිබේ. එහිදී ඔහු හැඳ සිටි කමිසය ගලවා අත්දෙක බැඳ මෙම රන්මාලය කොල්ලකා ඇති බව පොලිසිය සඳහන් කරයි.

කොල්ලකෑමට ලක්වූ සිසුවා බුලත්සිංහල ගෝවින්න පදිංචිකරුවෙකි.

කළුතර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති අයි. බී. පී. සුගතපාලගේ මගපෙන්වීම මත කළුතර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කපිල ප්‍රේමදාස, සහකාර පොලිස් අධිකාරි සුනෙත් ශාන්ත ඇතුළු නිලධාරිහු පරීක්ෂණ පවත්වති.





අගමැතිනිය ෂෙයික් හසීනා

# බංග්ලාදේශ අගමැතිනියට ඉල්ලා අස්වෙන්නැයි දැවැන්ත විරෝධතා

## 2009 සිට බලය හොබවන හසීනා ඒකාධිපතිනියක් බවට චෝදනා

එතෙර අරුණ

## පෙට්‍රල් බෝම්බ ගසා බස් රථවලට ගිනි තබති

## අගමැතිනියගේ ආධාරකරුවෝත් ප්‍රතිවිරෝධතා අරඹති

■ නිහාල් පීරිස්

බංග්ලාදේශයේ අගමැතිනි ෂෙයික් හසීනා වහා ඉල්ලා අස්විය යුතු යැයි පවසමින් එරට දැවැන්ත විරෝධතා පැවැත් වෙන්නට පටන් ගෙන තිබේ. පසුගිය දින කිහිපය පුරා බංග්ලාදේශ අගනුවර වන ඩකාහි විශාල විරෝධතා පැවැත් විණි. බස් රථවලට ගිනි තබා ඇති බවද, පෙට්‍රල් බෝම්බ එල්ල කර ඇති බවද විදෙස් මාධ්‍ය වාර්තා කර තිබේ. විරෝධතාකරුවන් මෙන්ම පොලිස් නිලධාරීන් ද මෙහි දී තුවාල ලබා තිබූ අතර 90කට ආසන්න සංඛ්‍යාවක් අත්අඩංගුවට ගෙන ඇති බව සඳහන් වේ. ප්‍රධාන වශයෙන්ම විරෝධතාවලට එක්ව සිටින්නේ එරට විරුද්ධ පක්ෂය වන බංග්ලාදේශ ජාතිකවාදී පක්ෂයේ ආධාරකරුවන්ය.

දිනෙන් දින ඉහළ යන ජීවන වියදම නිසා බංග්ලාදේශ ජනතාව මේ වනවිට දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටියි. ආණ්ඩුවට එරෙහි විරෝධතා පැවැත්වෙන්නේ ප්‍රධාන වශයෙන්ම මෙම කාරණය මුල් කරගෙනය. එමෙන්ම අගමැතිනි ෂෙයික් හසීනා ඒකාධිපති ස්වරූපයෙන් රට පාලනය කරන බවට ද චෝදනා එල්ල වේ. මානව හිමිකම් උල්ලංඝනය, දේශපාලන විරුද්ධවාදීන් මර්දනය කිරීම, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට බාධා කිරීම වැනි කාරණා සම්බන්ධයෙන් ඇයට දැන් කලෙක සිටම චෝදනා නැගේ.

'ආහාරවල මිල ගණන් සාමාන්‍ය ජනතාවට දරාගත නොහැකි ආකාරයෙන් දවසින් දවස ඉහළ යමින් තිබෙනවා. දැන් ඒ දවස්වල වගේ මෙම භාණ්ඩ මිල දී ගන්න ජනතාවට හැකියාවක් නැහැ. මේ නිසා ජනතාව අතර විශාල විරෝධයක් මතුවෙමින් තිබෙනවා' යැයි පසුගිය සිකුරාද පැවැති විරෝධතා ගැන සඳහන් කරමින් මාධ්‍යවේදියකු පවසා තිබිණි.

තව මාස කිහිපයකින්, 2024 ජනවාරි මාසයේ බංග්ලාදේශයේ මීළඟ මහ මැතිවරණය පැවැත්වීමට නියමිතව තිබේ. ඊට පෙර අගමැතිනි ෂෙයික් හසීනා සහ ඇයගේ අවාමි ලීග ආණ්ඩුව ඉල්ලා අස්විය යුතු බව විපක්ෂ විරෝධතාකරුවන්ගේ ඉල්ලීමය. ආණ්ඩුව ඉල්ලා අස්වී භාරකාර ආණ්ඩුවක් යටතේ මැතිවරණය පැවැත්විය යුතු බව ඔවුහු පවසති. නැතහොත් මැතිවරණ දූෂණ හරහා නැවතත් අවාමි ලීගය බලය අල්ලනු ඇති බවට ඔවුහු චෝදනා කරති. පසුගිය මැතිවරණවල දී ද මෙවැනි දූෂණ සිදු වූ බවට චෝදනා නැගේ.

බංග්ලාදේශයේ ප්‍රධාන විරුද්ධ පක්ෂය වන ජාතිකවාදී පක්ෂයේ නායිකාව බලීඩා ෂියාය. 2018 වසරේ ඇය වංචා දූෂණ චෝදනා යටතේ බන්ධනාගාරගත කරනු ලැබිණි. මේ වනවිට සෞඛ්‍ය හේතූන් මත ඇයගේ සිර දඬුවම තාවකාලිකව අත්හිටුවා තිබේ. කෙසේ නමුත් ඇයට එරෙහිව ඉදිරිපත් වූ චෝදනා ඇය දේශපාලනයෙන් ඉවත් කිරීම සඳහා ගෙන එන ලද ඒවා බවට අදහස් පළ විය.

බලිඩා ෂියා බන්ධනාගාරගත කිරීමෙන් පසු ඇයගේ ජාතිකවාදී පක්ෂයේ කටයුතු බොහෝ දුරට බිඳ වැටී තිබිණි. නමුත් මේ වනවිට ඔවුන් නැවතත් ශක්තිමත් වෙමින්, ක්‍රියාකාරී වෙමින් සිටින ආකාරයක් දැකිය හැකි වේ. ෂෙයික් හසීනාගේ පාලනයට එරෙහිව විරෝධතා මාලාවක් සංවිධානය කිරීමට පසුගිය කාලයේ එම පක්ෂය පියවර ගත්තේය. මෙම විරෝධතාවලට දස දහස් ගණනින් ජනතාව එක්ව සිටි අන්දම දැකිය හැකි විය. මෙම තත්ත්වය තුළ මීළඟ මැතිවරණය නිදහස් සහ සාධාරණ ආකාරයෙන් පැවැත් වුවහොත් ෂෙයික් හසීනාගේ පක්ෂයට යම් අභියෝගයක් එල්ල වීමට ඉඩක් තිබේ.

විරෝධතා පාලනය කිරීම සඳහා පොලිසිය කඳුළු ගෑස්, රබර් උණ්ඩ සහ බැටන් ප්‍රහාර යොදගෙන තිබිණි. කෙසේ වෙතත් සංවිධායකයන් පවසා තිබුණේ මෙම සතියේ ද විරෝධතා ඉදිරියට ගෙන යන බවයි. මේ අතර ආණ්ඩු පක්ෂය වන අවාමි ලීගයේ ආධාරකරුවන්ද මෙම විරෝධතාවලට එරෙහිව විරෝධතාවක් පැවැත්වීමට පියවර ගෙන තිබිණි. පොලිසිය විරෝධතාකරුවන් මර්දනය සඳහා ගෙන තිබූ පියවර බොහෝ පාර්ශ්වවල දෝෂ දර්ශණයට ලක්ව තිබේ. නමුත් එම පියවර සාධාරණීකරණය කරමින් ආණ්ඩු පක්ෂයේ ඇතැමුන් අදහස් පළ කර තිබිණි.

'ජාතිකවාදී පක්ෂයේ සහ ඔවුන්ගේ මිත්‍ර පක්ෂවල විරෝධතාකරුවන් බස් රථ හතකට ආසන්න සංඛ්‍යාවකට ගිනි තබා තිබුණා. ඊට අමතරව ඔවුන් විරෝධතා පැවැත්වූවේ ප්‍රධාන මාර්ග අවහිර වන ආකාරයෙනුයි. මේ ආකාරයෙන් ජනතාවගේ නිදහසට බාධා කරන්න කිසිදු දේශපාලන පක්ෂයකට අයිතියක් නැහැ. පොලිසිය පියවර ගත්තේ ඒ නිසයි' යනුවෙන් අවාමි ලීගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන රන්වීර් ෂකිල් ජෝයි සඳහන් කර තිබිණි.

ෂෙයික් හසීනාගේ වත්මන් පාලනය ආරම්භ වූයේ 2009 වසරේය. එයින් පසු 2014 සහ 2018 වසරවල පැවැති මැතිවරණ දූෂිත මැතිවරණ වූ බවට විරුද්ධ පක්ෂවලින් චෝදනා එල්ල විය. 2024 මැතිවරණය සාධාරණ ආකාරයෙන් පැවැත් වීමට ඇය පියවර ගනීවිද, එහි දී කුමක් වේවිද යන්න එරට දේශපාලනය ගැන උනන්දුවක් දක්වන බොහෝ දෙනා කුතුහලයෙන් බලා සිටින කාරණා බවට පත්ව තිබේ.





